**වයඹ පළාත් සභාව - 2014**

**----------------------------------**

වයඹ පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

**2.2.1 පළාත් සභා අරමුදල**

**--------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**2.2.2 අනෙකුත් ගිණුම්**

-----------------

(අ) ආදායම් ගිණුම්

------------------

පළාත් මූල්‍ය රීති අනුව ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත බලය ලබාදී ඇති ගණන්දීමේ නිලධාරීන් විසින් තමාට අයත් ආදායම් ගිණුම් සකස් කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වූවද, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ ආදායම් සංකේතයන්ට අදාල ගිණුම් 21 ක් 2015 ජූනි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) විසර්ජන ගිණුම් ඇතුලු අනෙකුත් ගිණුම්

------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව 2015 මාර්තු 31 දිනට ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුමේ නම | 2014 වර්ෂයට අදාල | | | |
|---|---|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i). විසර්ජන ගිණුම් | 26 | 26 | - | - |
| (ii). පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 73 | 52 | 21 | 168 |
| (iii). පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 | - | - |
| (iv). වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 04 | 03 | - |
| (v). අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 14 | 13 | 01 | 15 |
| එකතුව | 121 | 96 | 25 | 183 |

**2.2.3 ගණකාධිකරණ අඩුපාඩු**

--------------------------

වයඹ පළාත් සභාවට අයත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකතුව රු. 140,389,981 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණයෙන් හෙලිදරව් කර නොතිබූ අතර දෙපාර්තමේන්තු 04 ක, අමාත්‍යාංශ 02 ක හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ එකතුව රු. 5,136,682 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තු 05 ක එකතුව රු. 70,331,958 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි.

**2.2.4 නොසැසඳු පාලන ගිණුම්**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශ 02 ක සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර ඇති අත්තිකාරම් 'බී' ගිණුම්වල කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා දෙපාර්තමේන්තු පාලන ගිණුම් ශේෂය අතර එකතුව රු. 4,349,276 ක වෙනසක් පැවතුණි.

(ආ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වලට අදාලව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු. 17,233,929 ක වෙනසක්ද, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාංශයේ, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ (2013 වර්ෂය), ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, පළාත් ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම්වල භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු. 22,250,744 ක වෙනසක් පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තු 04 ක සීසී 10 ලේඛණය හා අත්තිකාරම් "බී" ගිණුම අතර එකතුව රු. 2,337,990 ක වෙනසක් පැවතුණි.

(ඈ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල සහ නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශයේ අත්තිකාරම් "බී" ගිණුමට අදාලව දෙපාර්තමේන්තු පොත් හා දෙපාර්තමේන්තු පාලන ගිණුම් අතර රු. 3,240,324 ක වෙනසක් පැවතුණි.

(ඉ) ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ සමාලෝචිත වර්ෂයට අදාල ණයගැති ශේෂය ලෙස ගිණුම සමඟ ඉදිරිපත් කල උපලේඛණ අනුව රු. 2,617,472 ක් ලෙස දක්වා තිබුණද, සැසඳීම් ප්‍රකාශයට ගෙන තිබුණේ රු. 3,355,263 ක් වීම නිසා ණයගැති ශේෂ අතර රු. 737,791 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කින් හා නිකවැරටිය මූලික රෝහලෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම් වශයෙන් රු.6,761,330 ක් පළාත් සභාවට ලැබිය යුතුව තිබුණි.

(ආ) අග්‍රිම ගිණුම්

-------------

පළාත් සභා කාර්යාලයේ, දෙපාර්තමේන්තු 02 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් භාණ්ඩාගාරයට නොපියවූ අග්‍රිම ශේෂවල එකතුව රු. 10,713,642 ක් වී තිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සභා ලේකම් කාර්යාලයේ, පළාත් අමාත්‍යාංශ 02 ක, දෙපාර්තමේන්තු 06 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. 11,572,506 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) අයවීමට ඇති සේවක ණය

----------------------------

පළාත් අමාත්‍යාංශ 05 ක, දෙපාර්තමේන්තු 13 ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සභා ලේකම් කාර්යාලයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ස්ථාන මාරු වී ගිය, මියගිය හා සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ වෙනත් හේතූන් මත නිරවුල් නොකළ ණය ශේෂවල එකතුව රු. 99,765,155 ක් විය.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

---------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මාවතගම දිස්ත්‍රික් රෝහලේ තණකොළ කපන යන්ත්‍ර දෙක හා විදුලි ජනක යන්ත්‍රය සඳහා ඉන්ධන ලීටර් 1,225 ක් වෙනුවෙන් රු.160,848 ක් වැය කර තිබුණද වැඩකල කාලය පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් හා පාවිච්චි කරන ලද ඉන්ධන ප්‍රමාණය පිළිබඳ විස්තර නොතිබීම හේතුවෙන් ඉන්ධන වැය වීමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු නොවීය.

(ආ) පුත්තලම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහනයක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබීම නිසා රාජකාරී ගමන් සඳහා යොදාගත් බවට වාර්තා වී ඇති කි.මී. 15336 ක ධාවන දුර ප්‍රමාණයන් පිළිබඳව විගණනයේදී ප්‍රමාණවත් පරීක්ෂාවක් කළ නොහැකි විය.

(ඇ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.572,265 ක් වටිනාකමැති වවුචර්පත් 09 ක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) පොරමඩල මහා විද්‍යාලයේ අවස්ථා 17 කදී රු. 112,743 ක් වටිනාකමැති ගෙවීම් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය බිල්පත් හා අනිකුත් ලේඛණ කිසිවක් නොමැතිව පාසල් සංවර්ධන සමිතියේ ගිණුමින් ගෙවීම් සිදුකර තිබුණි.

**2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) පනත්** | |
| 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 3.5 වගන්තිය | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් එකතු කළ මුදලින් 50% ක් වූ රු. 5,600,000 ක් පළාත් සභාව වෙත යවනු ලැබිය යුතු වුවත්, එසේ කටයුතු නොකර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ විශේෂ ගිණුමකට ඉන් රු.3,610,685 ක් බැර කර තිබුණි. |

(ආ) වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය

-------------------------------

| | |
| --- | --- |
| (i). ප.මූ.රී. 29.4 (ඔ) | පරිපූරක ඇස්තමේන්තුවකින් සලසන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් මාරු නොකරන ලෙස දක්වා ඇතත්, අවස්ථා දෙකකදී පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් රු.3,516,000 ක පරිපූරක ප්‍රතිපාදන මාරුකර තිබුණි. |
| (ii). ප.මූ.රී. 76.2.9 | වයඹ පළාත් සභාව විසින් පත්කරන ලද අධීක්ෂණ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සඳහා අධීක්ෂණ කටයුතුවල නියළුනු බවට කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබියදී සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් රු. 240,000 ක අධීක්ෂණ දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. |
| (iii). ප.මූ.රී. 164 (ආ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.28,005,174 ක් වටිනා වවුචර් සහතික කර ලියන ලද චෙක්පත් 38 ක් 2015 මාර්තු 06 දින වන විටත් භාණ්ඩ ලැබෙන තෙක් රඳවාගෙන තිබුණි. |
| (iv). ප.මූ.රී. 261 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්යාලය විසින් 2014 වර්ෂය තුළ රු. 8,062,884 ක අත්තිකාරම් මුදලක් විවිධ කටයුතු සඳහා නිලධාරීන් වෙත ලබාදී තිබුණු අතර අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කර තිබුණු බිල්පත්වල වටිනාකම රු. 6,014,180 ක් විය. ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර නිලධාරීන් වෙත ලබාදී තිබුණු අත්තිකාරම් මුදල රු. 2,040,704 ක් වූ අතර එය මුළු අත්තිකාරම් මුදලින් සියයට 25 ක ප්‍රතිශතයක් විය. එසේම නිලධාරීන් තිස්දෙදෙනෙකුට ලබාදී තිබූ රු. 1,650,500 ක අත්තිකාරම් මුදල්වලින් අත ඉතිරි වී තිබූ මුදල ලබාදුන් අත්තිකාරමට සාපේක්ෂව සියයට 24 ත් සියයට 84 ත් අතර පරාසයක් ගෙන තිබුණි. |

(v). ප.මූ.රී. 261.2.2

කලින් ලබාගත් අතුරු අග්‍රිමයක් පියවා නොමැති නිලධාරියෙකුට එය පියවන තෙක් නැවත අතුරු අග්‍රිමයක් නිකුත් නොකල යුතු බව දක්වා තිබුණද, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්යාලයේ නිලධාරීන් 16 දෙනෙකුට රු. 4,765,325 ක වටිනාකමැති අත්තිකාරම් මුදලක්ද නිකවැරටිය කලාප කාර්යාලයේ නිලධාරීන් 8 දෙනෙකුට රු. 344,250 ක අත්තිකාරම් මුදල්ද කලින් ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත ලබාදී තිබුණි.

(vi).ප.මූ.රී. 476

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට සිදුකල යුතුව තිබූ නමුත් දෙපාර්තමේන්තු 06 ක, අමාත්‍යාංශ 01 හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක අදාල දිනට සමීක්ෂණ කටයුතු නිම කර නොතිබුණි.

(ඇ) චක්‍රලේඛ

------------

(i). ජනාධිපති ලේකම්ගේ අංක.සී.ඒ/09/එන්.එස්.සී.සී/ පොදු/හා 2010 ඔක්තෝබර් 07 සහ අංක පී.සී.එම්.ඩී/1/4/23/ 1/14 හා 2012 අගෝස්තු මස 20 දිනැති ලිපි

සභා ලේකම් කාර්යාලයේ ඉහල තනතුරුවල වැටුප් තල, රාජ්‍ය සේවයේ සමාන තනතුරුවලට හිමි වැටුප් තලවලට වඩා ඉහල දමා තිබුණු අතර, ඒ සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. පළාත් සභාව විසින් පත් කරන ලද උපදේශක කමිටුවේ නිර්දේශ මත මෙම වැටුප් වැඩි කිරීම් සිදු කර තිබුණි.

(ii).2013 ජනවාරි 01 දිනැති අංක SFA/01/2012 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය

මූලික වැටුප ඉක්මවා අතිකාල හා අමතර දීමනා ගෙවීමේදී අදාල ප්‍රතිපාදන සීමාව තුල පමණක් ගෙවීම් කටයුතු සිදුකල යුතු වුවද පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ප්‍රතිපාදන ඉක්මවා රු.2,002,030 ක් අතිකාල හා අමතර දීමනා සඳහා වැය දරා තිබුණි.

| | |
|---|---|
| (iii). 2001 මාර්තු 28 දිනැති අංක 1/2001 දරන පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ(රේඛිය)චක්‍රලේඛය | පළාත් සභා මන්ත්‍රීවරයෙකුට දිය හැකි උපරිම ණය සීමාව වන රු. 250,000 ක මුදල 2009 මාර්තු 02 දිනැති 5 වන පළාත් සභාවේ අංක 5/1/ අමා/2009/2 තීරණය පරිදි රු. 500,000 දක්වා වයඹ පළාත් සභා ලේකම් කාර්යාලය විසින් වැඩි කර තිබුණි. |
| (iv). 2014 ජනවාරි 06 දිනැති අංක එෆ්සී/3/2/2014 දරන මුදල් කොමිෂන් සභා චක්රලේඛය | පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය සඳහා වෙන්කල ප්‍රතිපාදිත මුදල් උපයෝගී කරගෙන සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් රු. 1,439,710 ක් වටිනා කාර්යාල උපකරණ හා පුස්තකාල පොත් මිළදී ගෙන තිබුණි. |
| (v). වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ 2013 දෙසැම්බර් 13 දිනැති අංක ව/අධ්‍ය/පා.වි/10/05/01 දරන ලිපිය | කලාප අධ්‍යාපන කාර්යාල සඳහා මාසිකව අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් 400 ක් බව දක්වා තිබුණද, 2014 වර්ෂයේදී නිකවැරටිය, ඉබ්බාගමුව, ගිරිඋල්ල යන කලාප අධ්‍යාපන කාර්යාලවල ඉන්ධන ලීටර 1510 ක් වැඩිපුර ලබාගෙන තිබුණි. |

**2.2.8 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සංචිත වාහනයක් හිටපු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ හා දැනට වැඩ බලන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ ගමන් සඳහා යොදාගෙන තිබුණු අතර, 2012 ඔක්තෝම්බර් මස සිට 2014 දෙසැම්බර් මස දක්වා එම වාහනයට අනුමත ලීටර් 140 ක සීමාව ඉක්මවා රු.1,117,590 ක් වටිනා අතිරේක ඉන්ධන ලීටර් 9,352 ක් යොදවා තිබුණි.

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාහන අනුයුක්ත කිරීමට හිමිකම ලබන නිලධාරීන්ට ප්‍රවාහන දීමනාව ලබා දීම හෝ ආයතනය මඟින් වාහනයක් අනුයුක්ත කර දීම යන විකල්ප දෙකෙන් එක් විකල්පයක් පමණක් යොදා ගත යුතු වූවද, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ හිටපු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක මෙන්ම වර්තමාන වැඩ බලන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් තනතුරට අනුමත සීමාවද ඉක්මවා දෙපාර්තමේන්තුවෙන් ඉන්ධන සපයාගෙන තිබියදී සංචිත වාහනයක්ද භාවිතා කර තිබුණි. ඒ අනුව 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එකතුව රු.891,892 ක මාසික ඉන්ධන දීමනාවක්ද ලබාගෙන තිබුණි.

(ඇ) අධීක්ෂණ මන්ත්‍රීවරුන් ලෙස සේවය කිරීම වෙනුවෙන් ඉන්ධන දීමනා ගෙවීමට කිසිදු චක්‍රලේඛයකින් ප්‍රතිපාදන සලසා නොමැති වුවද, 2014 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා වයඹ පළාත් සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරුන් ලෙස සේවය කිරීම වෙනුවෙන් මසකට රු.10,000 බැගින් රු.240,000 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.

## 3. ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | 2014 ඇස්තමේන්තුගත ආදායම | 2014 තථ්‍ය ආදායම | 2013 ඇස්තමේන්තුගත ආදායම | 2013 තථ්‍ය ආදායම |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 10.02, 10.03 | නිෂ්පාදනය හා වියදම මත බදු | 5,153.00 | 5,036.40 | 4,941.00 | 4,007.15 |
| 20.02 | බදු කුලී, පොලී, ලාභ හා ලාභාංශ | 252.00 | 184.67 | 203.00 | 233.29 |
| 20.03 | විකුණුම් හා ගාස්තු | 623.00 | 486.78 | 447.00 | 461.11 |
| 20.06 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම | 27.00 | 11.77 | 2.00 | 0.24 |
| | එකතුව | 6,055.00 | 5,719.62 | 5,593.00 | 4,701.79 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක රු. 469,586 ක ආදායම් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන ආයතනවලට අදාලව ලැබී තිබූ උසාවි දඩ රු.26,695,655 ක් සහ මුද්දර ගාස්තු රු. 113,632,141 ක් අදාල පළාත් පාලන ආයතනවලට යවා නොතිබුණි. කෙසේ වෙතත් 2015 අගෝස්තු 25 දිනැති වයඹ ප්‍රධාන ලේකම්ගේ පිළිතුරු අනුව මෙම මුදල් මේ වන විට නිදහස් කර ඇති බව වාර්තා කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිරිවැටුම් බදුවලට අදාල ශේෂය රු. 205,635,373 ක්ද, දේපල පැවරීම් මත මුද්දර ගාස්තු ශේෂය රු. 96,907,915 ක්ද, සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 කින්, ඉඩම් කොමසාරිස් වෙත අයවිය යුතු බදු ශේෂය රු.35,003,490 ක්ද වශයෙන් හිඟ ආදායම් පැවතුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

---------------------

### 4.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 44,909,677 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 275,981,295 ක් විය.

### 4.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

ආදායම් හා වියදම්

---------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 5,153.00 | 5,036.39 | 116.61 | 4,941.00 | 4,007.15 | 933.85 |
| බදු නොවන ආදායම් | 902.00 | 683.22 | 218.78 | 652.00 | 694.64 | (42.64) |
| රජයේ ප්‍රදාන | 20,672.10 | 19,393.21 | 1,278.80 | 17,568.44 | 16,332.24 | 1,236.20 |
| එකතුව | 26,727.10 | 25,112.82 | 1,614.20 | 23,161.44 | 21,034.03 | 2,127.41 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 17,263.00 | 16,999.31 | 263.69 | 16,050.31 | 15,369.68 | 680.63 |
| අනෙකුත් වියදම් | 4,856.50 | 4,199.26 | 657.24 | 4,650.90 | 3,800.17 | 850.73 |
| උප එකතුව | 22,119.50 | 21,198.57 | 920.93 | 20,701.21 | 19,169.85 | 1,531.36 |
| ප්‍රාග්ධන වියදම් | 4,067.70 | 3,869.33 | 198.37 | 2,460.23 | 1,588.20 | 872.03 |
| එකතුව | 26,187.20 | 25,067.90 | 1,119.30 | 23,161.44 | 20,758.05 | 2,403.39 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුලු වියදමින් සියයට 85 ක් පුනරාවර්තන වියදම්ද, සියයට 15 ක් මූලධන වියදම්ද විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමින් බදු ආදායම් සියයට 20 ක්ද, බදු නොවන ආදායම් සියයට 3 ක්ද, රජයේ ප්‍රදාන සියයට 77 ක්ද විය.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේදී රු.805,722,284 ක් හා ඊට පෙර වර්ෂයේදී රු. 748,452,671 ක් භාණ්ඩාගර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

(ඈ) පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 08 කින් වැය විෂයයන් 13 කට සලසා තිබූ රු.471,338,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ශීර්ෂ 14 කට අදාල වැය විෂයයන් 36 කට සලසා තිබූ රු.78,140,274 ක ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා වූ පරාසයකින් ඉතිරි වීම් පැවතුණි.

**05. අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්**

---------------------------------------------------------------

**5.1 අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම්**

--------------------------------

**5.1.1 <u>වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය</u>**

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

(i). ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් භාවිතයේ පැවතියද, ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

b) දේපල පිරියත හා උපකරණ යනාදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii). ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ආකෘතිය අනුව ඊළඟ වර්ෂයේ ගෙවිය යුතු ණය වාරික ජංගම වගකීම් යටතේද ඉතිරි ශේෂය ජංගම නොවන වගකීම් යටතේද පෙන්විය යුතු වුවත්, ගෙවිය යුතු බැංකු ණය ශේෂය රු.18,268,487 ක් එසේ වෙන් නොකර දීර්ඝකාලීන ණය යටතේ දක්වා තිබුණි.

b) සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂික සඳහා වෙන්කිරීම රු.19,388,188 ක් අඩුවෙන් දක්වා තිබුණි.

c) ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කර වර්ෂයේ ශුද්ධ ලාභයට ගලපා නොතිබුණි. යන්ත්‍ර ඉවත් කිරීමෙන් ලද රු.691,167 ක මුදල ලැබීම් මුදල් ප්‍රවාහයක් ලෙසද හඳුනාගෙන නොතිබුණි.

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). කුලී ගාස්තු හා වාහන අලුත්වැඩියා ණයගැතියෝ ලෙස පැවති රු.41,946,329 ක මුදල තුල වසර 5 කට වඩා වැඩි කාලයක සිට ණයගැතියන් ලෙස පැවත එන ණය ශේෂවල වටිනාකම රු.17,471,469 ක් විය.

(ii). සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂයන්ගේ වටිනාකම රු.6,495,624 ක් වූ අතර, එතුල වූ වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ශේෂවල වටිනාකම රු.355,828 ක් විය.

(ඇ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (i). 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | පනත ප්‍රකාරව රු.13,279,214 ක් වටිනා බදු මුදල් වසර කිහිපයක සිට නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබුණි. |

(ii). 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත

සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදලට එම පනත් ප්‍රකාරව රු.16,158,908 ක අවකරණ ශේෂයන් නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) මෙහෙයුම් සමාලෝචනය

---------------------------

(i). කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) විගණන නියැදි පරීක්ෂාවේදී වාහන 13 ක් විකිණීමට හෝ භාවිතයට නොගැනීම හේතුවෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට විනාශ වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

b) 2011 වර්ෂයේ අප්‍රේල් මස ආරම්භ කර තිබුණු බැකෝ ලෝඩර්, මෝටර් ග්‍රේඩර් හා එක්ස්කැවේටර් යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු පාසලට 2013 වර්ෂයේ රු.6,700,000 ක් වැයකර බැකෝ ලෝඩර් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ කිසිදු ශිෂ්‍යයකු පුහුණු පාසලට ඇතුලත් වී නොතිබුණි.

c) මූල්‍ය පාලනය අයහපත්වීම නිසා සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලිය ලෙස රු.571,141ක් ගෙවා තිබුණි.

d) අබලන්වීම හේතුවෙන් වසර ගණනාවක සිට පාවිච්චියට ගත නොහැකිව ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලින් ඉවත්කර ඇති රු.19,661,021 ක් වටිනා යන්ත්‍ර සහ උපකරණ විෂයයන් 15 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. ඒවා ඉවත්කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(i) ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවය

-----------------------------------------------------------

ඉකුත් වර්ෂ කිහිපයක ආයතනයේ මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීමේදී නිරීක්ෂණය වූ පහත කරුණු අනුව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති බව නිරීක්ෂණය විය.

a) ආසන්න වසර 05 තුළ රු.53,996,739 ක අලාභයක් සිදුව තිබුණි.

b) ස්ථිර කාර්ය මණ්ඩලයේ 93 දෙනාගේ සේවා කාලය අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාරිතෝෂිත වටිනාකම රු.18,480,408 ක් වාර්ෂිකව ලාභයෙන් වෙන්කර ආයෝජනය නොකිරීම නිසා විශ්‍රාම යන සේවකයින්ට හිමි පාරිතෝෂිකය නියමිත දිනට ගෙවීමට මුදල් නොමැති තත්ත්වයක් පැවතුණි.

c) මුදල් නොමැතිවීම හේතුවෙන් සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් රු.6,158,908 ක් ගෙවා නොතිබුණි.

d) උසාවි නියෝගයක් මත වර්ෂ ගණනාවක සිට ගෙවිය යුතුව පැවති සේවක භාරකාර අරමුදල් අධිභාරය වූ රු. 3,466,174 ක්, මුදල් නොමැතිවීම හේතුවෙන් ගෙවා නොතිබුණි.

e) වසර ගණනාවක සිට රජයට ගෙවිය යුතු බදු මුදල් රු.13,279,214 ක්, මුදල් නොමැතිවීම හේතුවෙන් ගෙවා නොතිබුණි.

f) මෙහෙයුම් කටයුතු බැංකු අයිරා පහසුකම මත පදනම්වීම සහ ඒ මත විශාල අයිරා පොලී ගෙවීමට සිදුවීමෙන් සමාලෝචිත වර්ෂය වන විට බැංකු අයිරාව රු.1,498,873 ක් වූ අතර ගෙවූ අයිරා පොලිය රු.571,141 ක් විය.

g) ශුද්ධ වත්කම් රු.41,744,589 ක් වන අතර, එය රු.61,998,642 ක වගකීම් පියවීමට ප්‍රමාණවත් නොවීය.

h) ණයගැති කාල විශ්ලේෂණයට අනුව වසර 5 කට වඩා වැඩි ණයගැති ශේෂය රු.17,471,469 ක් බවත්, මෙම ණය බොල් ණයවීමේ වැඩි අවදානමක් ඇති බවත් නිරීක්ෂණය විය.

(ii) මෝටර් රථ වාහන 04 ක් භෞතිකව පරීක්ෂා කිරීමට යන්ත්‍රෝපකරණ අධිකාරි පරිශ්‍රය තුල නොතිබූ අතර, බැහැර සේවා සඳහා යොදවා ඇති ලේඛණය අනුව මෙම වාහන පිටත සේවා ස්ථානයන්හිද යොදවා නොතිබුණි.

(ඉ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). වර්ෂ ගණනාවක සිට ප්‍රමාණවත් සේවා ඉල්ලුමක් ලබාගැනීමට සැලසුම් පිළියෙල නොකිරීම හේතුවෙන් පිරිවැය වටිනාකම රු.16,843,685 ක් වූ රථවාහන 08 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii). විගණන නියැදි පරීක්ෂාවේදී පිරිවැය වටිනාකම රු. 25,376,967 ක් වූ රථ වාහන 11 ක් වර්ෂ ගණනාවක සිට සුළු සේවා කටයුතු නොකිරීම හෝ සේවා සඳහා අවශ්‍ය අමතර උපාංග ලබා නොගැනීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

### 5.1.2 <u>මානව සම්පත් සංවර්ධන අධිකාරිය</u>

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

තත්ත්වාගණනය කල මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

----------------------

නිලධාරීන් 33 දෙනෙකුගේ සේවක ඇප වශයෙන් ලංකා බැංකුවේ තැන්පත් කර ඇති රු. 479,591 ක තැන්පත් මුදල් ජංගම වත්කම් හා ජංගම වගකීම් යටතේ පෙන්වා නොතිබුණි.

(ඇ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i). මුදල් රෙගුලාසි 1653 | වාහනය පාවිච්චි කරන නිලධාරියා විසින් එක් එක් දවසේ ගමනාරම්භයේ සහ අවසානයේ මයිලෝ මීටරය පරීක්ෂා කොට රියදුරු විසින් දෛනික ධාවන සටහනේ ලියා ඇති සැතපුම් සටහන අත්සන් කළ යුතු වුවත් එක් වාහනයක ධාවනය කර තිබුණු කි.මී. 8650 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii). | පළාත් මූල්‍ය රීති 261.2.2 | මූල්‍ය රීති ප්‍රකාරව අවස්ථා 04 කදී ලබාගත් රු. 187,000 ක අත්තිකාරම් පියවීම සිදුකර නොතිබුණි. |
| (iii). | වයඹ ප්‍රධාන ලේකම්ගේ 2011 දෙසැම්බර් 15 දිනැති අංක ව/ප්‍රලේ/5/4/8 දරන චක්‍රලේඛය | ඇප තැබිය යුතු පළාත් රාජ්‍ය නිලධාරීන් 06 දෙනෙකුගෙන් ලබාගත යුතු රු. 124,000 ක ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv). | වයඹ ප්‍රධාන ලේකම්ගේ 2014 ජනවාරි 28 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයේ 1.2.1 ඡේදය | විධායක අධ්‍යක්ෂකවරයා සඳහා 2014 ඔක්තෝබර් සිට 2015 ජනවාරි දක්වා රු. 61,645 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් (ඩීසල්) 545 ක ප්‍රමාණයක් නියමිත ප්‍රමාණයට වඩා වැඩිපුර ලබාදී තිබුණි. |
| (v). | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන චක්‍රලේඛය | සාමාන්‍යාධිකාරිවරයා වෙනුවෙන් 2014 ඔක්තෝබර් සිට 2015 පෙබරවාරි දක්වා රු. 78,913 ක ඉන්ධන ලීටර් 710 ක් වැඩිපුර ලබාදී තිබුණි. |

(ඈ) මෙහෙයුම් සමාලෝචනය

----------------------------

(i). කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) අධිකාරිය විසින් වර්ෂ 2009 - 2014 කාලපරිච්ඡේදය තුල පුද්ගලයින් 15 දෙනෙකුට හා සමිති සමාගම් 16 කට ලබාදී තිබූ රු.4,150,000 ක ණය මුදලින් කිසිදු මුදලක් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

b) ව්‍යාපෘති ණය අයනොවීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම

---------------------------------------------------------------

එක් එක් ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබුණු ණය මුදල් අතුරින් දිගින් දිගටම ණය ගෙවීම පැහැර හැරීම මත ව්‍යාපෘති 03 කට අදාලව පුද්ගලයින් 26 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,094,982 ක ණය මුදල් අය නොවීම සම්බන්ධයෙන් 2014 වර්ෂය තුළ සමථ මණ්ඩලය වෙත යොමුකර තිබුණි. ව්‍යාපෘති 04 කට අදාලව පුද්ගලයින් 41 දෙනෙකුගෙන් අය නොවී පැවති රු.1,349,279 ක ණය ශේෂයක් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි.

(ii). හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පාරම්පරික බිත්තර වී වලින් සහල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට රු. 142,400 ක පාඩුවක් සිදුවී තිබුණි.

(iii). නිශ්කාර්ය වියදම්

-----------------

මානව සම්පත් සංවර්ධන අධිකාරියෙහි ණය යෝජනා ක්‍රමය සඳහා පරිගණක මෘදුකාංගයක් සකස් කිරීම වෙනුවෙන් වැයකර තිබූ රු. 891,251 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

**5.1.3 <u>මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය</u>**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 02 සිට වසර 14 දක්වා වූ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.1,073,827 ක් වූ ලැබියයුතු ශේෂවල වටිනාකම අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (i). පළාත් මූල්‍ය රීති 261.2.2 | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීමේදී එක් අවස්ථාවකදී රු.100,000 සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදෙන්නේ නම් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, අවස්ථා 09 කදී ලබා දුන් රු.1,985,000 ක අත්තිකාරම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii). අංක 1324 හා 2004 ජනවාරි 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (සංශෝධිත) 2.1 ඡේදය | විවෘත අවම ටෙන්ඩර් ක්‍රියා පරිපාටියක් මඟින් බලපත්‍රධාරීන් තෝරාගැනීම කළයුතු වුවත්, 2013 ජනවාරි 01 දින සිට 2014 අගෝස්තු 31 දක්වා ලබාදී තිබුණු නව මාර්ග බලපත්‍ර 106 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

(ඈ) මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

(i) මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(a) 2001, 2002 හා 2009 වර්ෂයන්වල අවස්ථා 04 කදී ලබාදී තිබූ රු.115,500 ක අත්තිකාරම් මුදල්, විගණිත දිනය වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(b) සේවා ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී එක් නීතිඥවරයෙකු වෙත නීති වියදම් ලෙස රු.409,000 ක් ගෙවා තිබුණි.

(ii) අනාර්ථික ගණුදෙනු

-----------------------

ආයතනයේ ක්‍රියාකාරිත්වයට හෝ අරමුණුවලට අදාල නොවන පරිදි රු.143,270 ක් වැයකර ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි.

(iii) හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(a) 2013 ජනවාරි මාසයේ සිට 2014 ජූලි මාසය දක්වා ලබාදී තිබූ නව බලපත්‍ර 38 ක් සඳහා ටෙන්ඩර් මඟින් අයදුම්පත්‍ර නොකැඳවීම හේතුවෙන් අධිකාරියට රු.437,000 ක මුදලක් අහිමි කර තිබුණි.

(b) 2013 ජනවාරි මස සිට 2014 අගෝස්තු 31 දක්වා නිකුත් කර තිබූ නව බලපත්‍ර 102 කට අදාලව නියමිත ගාස්තුව අය නොකිරීම හේතුවෙන් රු.32,359,000 ක අලාභයක් සිදුවී තිබුණි.

**5.1.4** <u>පළාත් පරිසර අධිකාරිය</u>

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). සමාලෝචිත වර්ෂයට අදාලව රු. 270,064 කින් ණයහිමියන් සහ ණයගැතියන් අඩුවෙන් දක්වා තිබුණි.

(ii). රු. 4,419,777 ක් වටිනාකමැති වත්කම් වර්ග 04 ක් ක්ෂය කර අවසන්ව පැවතියද ඒවා ප්‍රයෝජනයට ගන්නා නමුත් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------

වයඹ ප්‍රධාන ලේකම්ගේ 2011 දෙසැම්බර් 15 දිනැති අංක ව/ප්‍ර.ලේ/5/4/1/8 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකු සඳහා චක්‍රලේඛ ප්‍රකාරව රු. 111,000 ක් ඇප තැබිය යුතු වූවත්, රු. 40,000 ක් පමණක් ඇප තබා තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

--------------------------

(i) කාර්ය සාධනය

----------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) 2010 දෙසැම්බර් 21 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත ක්ෂේත්‍ර පරීක්ෂාවක් මඟින් හඳුනා ගැනීමේ වැඩ පිළිවෙලක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර නොතිබූ අතර, කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම් මත පමණක් පරීක්ෂා කර බලපත්‍ර නිකුත් කර තිබුණි.

b) බලපත්‍ර නිකුත් කිරීම් නිසි පරිදි ලේඛණගත කර, එම බලපත්‍ර වාර්ෂිකව අලුත් කරන්නේද යන්න පරීක්ෂා කිරීමට හැකිවන පරිදි ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර, අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන බලපත්‍ර පමණක් අලුත් කිරීම සිදුකර තිබුණි. ඉල්ලීම් නොකරන බලපත්‍රහිමියන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(i). කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

අධිකාරියේ පරිසර සංරක්ෂණ ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම සඳහා ජංගම රසායනාගාරයක් ස්ථාපිත කිරීමට ප්‍රධාන අමාත්‍යාංශයෙන් රු. 3,455,311 ක් ලැබී තිබූ අතර, අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට එම මුදල වියදම් කර තිබූ නමුත් ජංගම රසායනාගාරය ක්‍රියාකරවීම සඳහා දැනුමක් ඇති නිලධාරියකු එම තනතුරට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) මෙහෙයුම් ආකාර්යක්ෂමතා

-------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) ව්‍යාපෘති 05 කට අදාලව 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පරිසර අධිකාරිය විසින් රු.270,064 ක අතිරික්ත වැයක් දරා තිබුණද එම මුදල අදාල ආයතනවලින් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

b) 2015 පෙබරවාරි 18 දින සිදුකල භෞතික විගණන පරීක්ෂාවේදී පරිසර බලපත්‍ර ලබාගත යුතු ස්ථාන 8 ක් හඳුනාගත් නමුත්, එම කිසිදු ආයතනයක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. එම ආයතන සියල්ලම මගින් පරිසරයට යම් හානියක් සිදුවිය හැකි බව නිරීක්ෂණය වුවද එම හානි වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**5.1.5** <u>වයඹ සංවර්ධන අධිකාරිය</u>

(අ) මූල්‍ය ප්‍රකාශන

-----------------

තත්ත්වාගණනය කල මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

(i). ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

a) රු. 839,727 ක වටිනාකමැති අයහාර වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකිරීම හේතුවෙන් අයහාර වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ගිණුම්ගතවී තිබුණි.

b) 2008 හා 2009 වර්ෂයේ අයහාර වියදම් ලෙස කපා හල රු. 489,914 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් වියදමක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනගත කර තිබුණද ඒ සඳහා ක්ෂය ගැලපීමක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් ගොඩනැගිලිවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

c) බඩගමුව සංචාරක මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයට අදාල බදු කුලී ආදායම රු. 648,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

d) ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් ලෙස ගෙන තිබුණු පිරිවැය රු. 7,587,660 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 142 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම්වල පැවති අතර ඒවා ප්‍රත්‍යාගණනය කර වර්තමාන වටිනාකමට ගිණුම්වලට ගෙන නොතිබුණි.

e) අධිකාරිය විසින් වයඹ පළාත් සභාවේ සංචාරක හා හෝටල් කළමනාකරණය නමින් හෝටල් පාසලක් පවත්වාගෙන යාම සඳහා වසර 08 ක් තුළ කරන ලද ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.85,739,716 ක මුදලක් වැය කර ඇතත්, එය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(i). ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන්ගෙන් හා බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව තිබුණු ශේෂවල වටිනාකම රු. 7,091,606 ක් වූ අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන්ගෙන් වසර 02 ක් ඉක්ම වූ රු. 724,136 ක පැරණි ලැබිය යුතු ශේෂයන්ද පවතින බව නිරීක්ෂණය විය.

(ii). ගෙවිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 7,775,872 ක් විය. මෙම ගෙවිය යුතු ගිණුම් තුළ වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ශේෂවල එකතුව රු. 2,630,873 ක් වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නිෂ්කාර්ය වියදම්

---------------------

2014 ජනවාරි 01 දින සිට වයඹ සංවර්ධන අධිකාරියට පත්වීම් ලබාදී ඇති නිලධාරීන් දෙදෙනෙකු ප්‍රධාන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුයුක්ත කර ඇති අතර, ඒ සඳහා රු.480,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

(ඉ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පළාත් මුල්‍ය රීති 277.2 ප්‍රකාරව 2014 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම ලියන ලද නමුත් ගෙවීම් සඳහා නිකුත් නොකරන ලද රු.3,323,577 ක් වටිනා චෙක්පත් 16 ක් අතරඳවාගෙන තිබුණි.

(ඊ) ආර්ථික නොවූ ගනුදෙනු

---

ඉබ්බාගමුව තලාගස්වැව සංචාරක මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා 2009 වර්ෂයේ සිට 2014 වසර දක්වා කාලය තුළ රු. 1,408,565 ක් විවිධ කාර්යයන් සඳහා වියදම්කර ඇතත් එය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දරා ඇති වියදම අනාර්ථික වියදමක් වී තිබුණි.

(උ) මෙහෙයුම් සමාලෝචනය

---

මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). වයඹ පළාත් සභාව යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදනවලින් හෝටල් පාසැලක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු.95,526,483 ක මුදලක් වැය කර තිබුණද එයින් වයඹ පළාත් සභාවට කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගෙන රජයෙන් බාහිර වෙනත් ආයතනයක් වෙත අවබෝධතා ගිවිසුමක් මඟින් මෙම දේපල පවරා තිබුණි.

(ii). ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් හෝටල් පාසැලේ පාඨමාලා පැවැත්වීම, සිසුන් බඳවා ගැනීම, විභාග පැවැත්වීම, සහතික පත්‍ර ප්‍රදානය කිරීම, ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීම සහ වැඩිදුර අධ්‍යාපනය යන කරුණු ඉටු කිරීමේ කාර්යයයේ නියුක්ත වන අතර එම ආයතනය උපයන ආදායමින් කිසිදු ප්‍රතිලාභයක් පළාත් සභාවට අයකර නොගන්නා බව නිරීක්ෂණය විය.

**5.1.6 පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

---

(අ) මූල්‍ය ප්‍රකාශන

---

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

ගිණුම්කරණ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය තුළ වර්ෂයට අදාල ක්ෂය ලෙස රු. 2,935,146 ක් දක්වා තිබුණද, ගිණුම් අනුව වර්ෂයට අදාල නිවැරදි ක්ෂය වටිනාකම රු.3,691,552 ක් වීම හේතුවෙන් රු.756,406 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(i). මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) අධිකාරියේ රියදුරුවරයෙකු හා කාර්යාල කාර්ය සහායකයකු පිළිවෙලින් 2014 දෙසැම්බර් හා 2014 පෙබරවාරි සිට ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරි සඳහා යොදවා ඒ සඳහා රු.194,565 ක් අධිකාරිය විසින් වැටුප් ලෙස ගෙවා තිබුණි.

b) අධිකාරියේ ප්‍රධාන අරමුණුවලින් බැහැර කටයුතු සඳහා අවස්ථා 04 කදී රු. 122,300 ක් ගෙවා තිබුණි.

**5.1.7 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය**

**(අ) මූල්‍ය ප්‍රකාශන**

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

**(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

(i). **ආයතනයේ අඛණ්ඩ පැවැත්ම**

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 06 න් 03 ක් පාඩු ලබා තිබූ අතර, ඊට පෙර වර්ෂවලදී ක්‍රියාත්මක තත්ත්වයේ තිබූ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොකිරීම හේතුවෙන් අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ii). **ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) බහුදින ෆයිබර් යාත්‍රා අච්චුවෙහි නියමිත වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

b) PCR ව්‍යාපෘතියට අදාල පරීක්ෂණ 67 ක ආදායම වූ රු.150,750 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

c) ෆයිබර් නිෂ්පාදන විකුණුම් වටිනාකම රු.1,825,505 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර, ලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

d) පොත් අගය රු.14,979,985 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබූ අතර, එම වත්කම්වලට අනුරූපී සමුච්චිත ක්ෂය වටිනාකම ද රු.5,548,515 කින් අඩුවෙන් දක්වා තිබුණි.

e) PCR ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබූ මුළු පරීක්ෂණ වලින් සියයට 79 ක් වන පරීක්ෂණ 952 ක ආදායම වූ රු.2,142,000 ක් ගිණුම්ගතකර ඇති ආකාරය පිළිබඳ කිසිදු පැහැදිලි කිරීමක් ඉදිරිපත් නොවීය.

**(ඇ)** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් කර නොතිබූ ණය ගැති හා ණය හිමි ගිණුම්හි වටිනාකම් පිළිවෙලින් රු.5,049,115 ක් හා රු.3,381,610 ක් විය.

**(ඈ)** **මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**හඳුනාගත් පාඩු**

**---------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). සින්න පාඩුව අභිජනනාගාරයේ තිබූ පොත් අගය රු. 151,150 ක් වූ භාණ්ඩ අස්ථානගත වී තිබුණි.

(ii). වටිනාකම රු.294,922 ක් ජල තත්ත්ව පරීක්ෂණ සඳහා භාවිතා කරනු ලබන රසායන ද්‍රව්‍ය කල් ඉකුත් වී තිබුණි.

(ඉ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

අධිකාරිය සතු මත්ස්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය, මත්ස්‍ය සැකසුම් ව්‍යාපෘතිය, සින්නපාඩුව අභිජනනාගාරය, මුන්දලම නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ තිබූ වටිනාකම රු. 16,077,000 ක්වූ ගොඩනැගිලි 05 ක්ද, වටිනාකම රු. 11,829,373 ක්වූ යන්ත්‍ර උපකරණ 24 ක්ද, වසර 05 සිට 08 දක්වා වූ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**5.1.8** <u>**කර්මාන්ත සේවා කාර්යාංශය**</u>

(අ) මූල්‍ය ප්‍රකාශන

------------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

(i). ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

a) ස්ථාවර වත්කම්වල ක්ෂය කිරීමේ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී වෙනස් කර ඇති නමුත් ඒ බව ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

b) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වත්කම් ක්ෂය රු.3,642,260 කින් ඉහල ගොස් තිබුණි. ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීම තුලින් මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර තිබූ අතර, එය මූල්‍ය ප්‍රතිඵලයටද අහිතකර ලෙස බලපා තිබූ බව නිරීක්ෂණය විය.

(ii). ගිණුම්කරණ අඩුපාඩු

----------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලට ඇතුලත් කර ඇති විෂයයන් 03 ක වටිනාකම ගිණුම් සමඟ සැසඳීමේදී රු. 30,391,564 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(i). ලැබිය යුතු ශේෂ

-----------------

සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ සඳහන් පූර්ව වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලද වසර 2 ක කාලය ඉක්මවා ගොස් තිබූ ලැබිය යුතු ගිණුම් විෂයයන් 22 ක රු. 9,835,761 ක ශේෂයන් පිළිබඳ විමර්ශණය කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii). ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ සඳහන් පූර්ව වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලද වසර 02 ක කාලය ඉක්මවා ගොස් තිබූ ගෙවිය යුතු ගිණුම් විෂයයන් 18 ක රු. 4,339,034 ක ශේෂයන් පිළිබඳ විමර්ශණය කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i). පළාත් මූල්‍ය රීති 261.2.2 | සමාලෝචිත වර්ෂය තුලදී ලබාගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර එකී පුද්ගලයින්ටම නැවත රු.754,000 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. |
| (ii). පළාත් මූල්‍ය රීති 546 | ඇප තැබිය යුතු නිලධාරීන් කිසිවකු ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. |

(ඉ) මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). සමාලෝචිත වර්ෂය අවසානය වන විට කාර්යාංශය විසින් පවත්වාගෙන යන අංක 713494 දරන බැංකු ජංගම ගිණුමේ හා අංක 713534 දරන බැංකු ජංගම ගිණුමේ මුදල් පොත්වල මාසික සාමාන්‍ය මුදල් ශේෂය රු.4,959,270 ක් හා රු.3,790,966 ක් ලෙස පවත්වා ගෙන ගොස් තිබුණු අතර, පැවතිය යුතු අවම ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ හැකියාව පිළිබඳව සොයා බලා නොතිබුණි.

(ii). ආයතනය විසින් 2012 වර්ෂයේදී රු.1,480,000 ක් ගෙවා මිලදී ගත් එග් ඉන්කියුබේටරය 2015 වර්ෂය වන තුරු කාර්යාංශය වෙත නොලැබීම සම්බන්ධයෙන් අධිකරණයෙහි නඩු පවරා තිබුණි. මෙම නඩුව සඳහා ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.42,250 ක වියදමක් දරා තිබුණි.

**5.1.9 වයඹ ජනකලා පදනම**

**------------------------**

(අ) මූල්‍ය ප්‍රකාශන

------------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

(i). ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) රු.532,933 ක් වූ සමාලෝචිත වර්ෂයේ ආපසු යැවූම් ගැණුම් වටිනාකමින් දෙවරක් අඩු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.532,933 කින් වැඩියෙන් වාර්තා වී තිබුණි.

b) සමාලෝචිත වර්ෂයේ මිලදී ගනු ලැබූ කාර්යාල උපකරණ හා සංගීත උපකරණවල වටිනාකම රු.270,117 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii). නොසැසඳුන පාලන ගිණුම්

-----------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලයේ හා විකුණුම් මධ්‍යස්ථාන 03 ක අවසාන තොග වටිනාකම් අතර රු. 1,510,469 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඇ) ලැබිය යුතු ගිණුම්

-------------------

අලෙවි මධ්‍යස්ථාන විසින් ණයට අලෙවිකර තිබූ එකතුව රු. 217,577 ක මුදලක් වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි.

(ඇ) නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (i). පළාත් මූල්‍ය රීති | |
| a) ප.මූ.රී. 261.2.2 | අත්තිකාරම් ලබාගත් කාර්ය අවසන් වූ වහාම පියවිය යුතු වූවත්, නිලධාරීන් 10 දෙනෙකුට ලබාදී තිබූ රු. 626,250 ක අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 28 ත් 267 ත් අතර කාලපරාසයක් ගෙන තිබුණි. |
| b) ප.මූ.රී. 471.1 හා 471.2 | අලෙවි කිරීමේ අරමුණින් 2014 වර්ෂය සඳහා රු.18,359,339 ක් වූ තොග මිලදී ගෙන ඇතත් එක් එක් තොග විෂයය සඳහා ලැබීම්, නිකුත් කිරීම් හා ශේෂය වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි තොග පොත් නඩත්තු කර නොතිබුණි. |
| (ii). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3. ඡේදය | 2008 වර්ෂයෙන් පසු නියමිත පරිදි සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි. |

(ඉ) මෙහෙයුම් සමාලෝචනය

---

(i). කාර්ය සාධනය

---

a) කුරුණෑගල විස්කම් විකුණුම් මධ්‍යස්ථානයේ ලාභය 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 66 කින් අඩුවී තිබුණි.

b) හලාවත විස්කම් විකුණුම් මධ්‍යස්ථානයේ 2011 වර්ෂයේ සිට මේ දක්වා ශුද්ධ අලාභයක් ලබා තිබූ අතර, එම අලාභය 2014 වර්ෂයේදී 2013 වර්ෂයට සාපේක්ෂව රු.298,119 කින් එනම්, සියයට 51 කින් වැඩිවී තිබුණි.

(ii). කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

කුලියට ලබාදී තිබූ කාමර 05 ක අවසන් කුලී ගිවිසුම් කාලයෙන් පසු කුලී පදනමට ලබාදීම හෝ වෙනත් ඵලදායි කාර්යයක් සඳහා භාවිතා නොකර, නිශ්කාර්යව පැවතීම හේතුවෙන් උපයා ගැනීමට හැකිව තිබූ රු. 1,425,000 ක කුලී ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි.

(iii). මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

වයඹ ජනකලා පදනමේ රූස්වීම් ශාලාව ඉදිකිරීම 2010 වර්ෂයේ ආරම්භ කර අදියර 02 ක් යටතේ රු.10,752,379 ක් වියදම් කර තිබුණද එය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයටගත හැකි තත්ත්වයට පත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv). මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

වයඹ ජනකලා පදනමේ අරමුණුවලට අනුකූල නොවන කටයුතු සඳහා 2014 වර්ෂය තුළ රු.384,660 ක් වියදම් දරා තිබුණි.

(v). වාහන උපයෝජනය

---------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) වයඹ ජනකලා පදනමේ රියදුරන් ලෙස සේවය කරන රියදුරු මහතුන්ගේ සුපුරුදු අත්සන සමඟ නොසැසඳෙන අත්සන් යෙදූ රජයේ ඉන්ධන ඇණවුම් 17 ක් යටතේ රු.100,071 ක වටිනාකමින් යුතු ඉන්ධන ලීටර 860 ක් සංචිත වාහන ධාවනය කරන නිලධාරීන් විසින් ලබාගෙන තිබුණි.

b) වයඹ ජනකලා පදනමේ රියදුරන් ලෙස සේවය කරන අයගේ අත්සන නොමැතිව රජයේ ඉන්ධන ඇණවුම් 06 ක් සඳහා රු.25,435 ක වටිනාකමින් යුතු ඉන්ධන ලීටර 265 ක් වාහන ධාවනය සඳහා යොදා ගන්නා නිලධාරීන් විසින් ලබාගෙන තිබුණි.

**5.1.10 ක්‍රීඩා අරමුදල**

---------------

(අ) **මූල්‍ය ප්‍රකාශන**

---------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

ආයතනය විවෘතව තබන වේලාවන් ප්‍රදර්ශනය කර නොමැති වීමත්, විධිමත් ආරක්ෂක වැඩපිළිවෙලක් නොවීමත් හේතුවෙන් ඇතැම් පිරිස් මධ්‍යම රාත්‍රිය දක්වා ආයතනයේ රැඳී සිටීම නිසා විදුලිය, ජලය, සේවක අතිකාල වැනි පොදු කාර්යය වැය විෂයයන් සඳහා අතිරේක වැය බරක් දැරීමට සිදු වී තිබුණි.

**(ඇ) අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

2006 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රදාන වැඩසටහන යටතේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ලැබී තිබුණු රු.1,100,000 ක මුදල අදාල කාර්යය සඳහා යොදවනවා වෙනුවට ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි.

**(ඈ) විධිමත් පරිදි පවරා නොගත් දේපල**

---------------------------------

ශිල්ප ශාලිකාව පිහිටි ඉඩම 2015 අගෝස්තු මාසය වන විටත් පවරාගෙන නොතිබුණි.

**5.1.11 සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල**

-----------------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන

------------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබියයුතු ස්ථාවර තැන්පත් පොලී රු.285,960 ක් ගිණුම්වලට ගෙන නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල රු.392,342 ක් වූ පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ පොලී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.106,382 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

----------------------------

කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

2004 අංක 03 දරන සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල් ප්‍රඥප්තියේ 4.2 වගන්තිය ප්‍රකාර යටිතල පහසුකම් නඩත්තු කිරීමේ මණ්ඩලය වසර දෙකක කාලයක් සඳහා වයඹ ප්‍රධාන ලේකම්වරයා විසින් පත්කළයුතු වුවද, එකී පත්කිරීම 2013 ජූලි 31 දිනෙන් අවසන්ව තිබූ නමුත් 2015 මාර්තු මාසය දක්වාත් නව මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.1.12** <u>ප්‍රධාන අමාත්‍ය අරමුදල</u>

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය නොකල මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මෙහෙයුම් සමාලෝචනය

--------------------------

කාර්ය සාධනය

-----------------

(i). වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම, ආගම නංවාලීම සඳහා හෝ ආගමික වත්පිළිවෙත් පවත්වා ගෙන යෑම, වයඹ පළාත වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම යනාදී කරුණු ප්‍රධාන අමාත්‍ය අරමුදලේ මෙහෙවර හා පරමාර්ථවලට ඇතුළත් වුවත් ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ii). අරමුදලේ සමස්ථ වියදමින් සියයට 87 ක් හෙවත් රු.2,448,000 ක් වෛද්‍යාධාර සඳහා වැය කර තිබුණු අතර ඊට අමතරව ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම හා අධ්‍යාපනය සඳහා පිළිවෙලින් රු.250,000 ක් හා රු.80,000 ක මුදලක් පමණක් වැය කර තිබුණි.

(iii). 2005 වර්ෂයේ ආරම්භ කර ඇති සුනාමි අරමුදලට එකතු කර තිබුණු මුදලින් ඉතිරි වූ මුදල වන රු.2,000,000 ක් යොදා 2008 වර්ෂයේදී ලංකා බැංකුවෙහි ස්ථාවර තැන්පතුවක් ආරම්භ කර තිබුණු අතර මේ වන විට ඊට අදාල පොලියද සමඟ එය රු.4,154,834 ක් දක්වා වර්ධනය වී තිබුණි. මෙම අරමුදල 2008 වර්ෂයේ සිට කිසිදු කටයුත්තකට භාවිතා නොකර නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

**5.1.13 <u>සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යොජනා ක්‍රමය</u>**

(අ) **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

**(ආ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**----------------------------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව නිකුත් කර මාස 06 ඉක්මවූ වටිනාකම රු.269,549 ක් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙනුවෙන් පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට 2010 වර්ෂයේදී බාහිර ආයතනයක් වෙත රු.168,000 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

**5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්**

**----------------------------**

**5.2.1 වයඹ පුහුණු ආයතනය - ගිණුම් අංක 26002**

**------------------------------------------------**

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). ආයතනය නමින් වාරියපොල ලංකා බැංකු ශාඛාවේ පැවති අංක 0005817516 දරන බැංකු ජංගම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට වූ රු. 268,119 ක ශේෂය 2009 වර්ෂයේ සිටසමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර නොතිබුණි.

(ii). සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතුව පැවති ආදායම් රු.537,167 ක් ගිණුම්වලින් අත්හැරී තිබූ නිසා වර්ෂයේ ආදායම හා ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(iii). රු. 264,565 කට මිලදී ගෙන තිබූ පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුලත් කර නොතිබූ නිසා සමාලෝචිත වර්ෂයේ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් වාර්තා වී තිබුණි.

(iv). වයඹ පුහුණු ආයතනයේ වත්කම් කස්සේරු කිරීමට අදාල තක්සේරු වාර්තාව 2013 ජූනි 28 දින ලැබී තිබුණද, එම තක්සේරු වාර්තාවේ වටිනාකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම්වල අගය රු. 31,639,415 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (i). ප.මු.රී. 375.1 | මුදල් වර්ෂය තුල අත්තිකාරම් ගිණුම් කටයුත්තක් මෙහෙයවීමෙන් ශුද්ධ පාඩුවක් අපේක්ෂා කරයි නම් හා අදාල බලධාරියා විසින් එසේ පාඩු ලැබීම අනුමත කරන්නේ නම් ඇස්තමේන්තුවල ශුද්ධ පාඩුව කපා හැරීම සඳහා ප්‍රතිපාදන සලසා ගතයුතු වූවත්, එසේ කර නොතිබුණි. |
| (ii). ප.මු.රී. 377.1 | අත්තිකාරම් ගිණුම් කටයුත්තෙහි ප්‍රාග්ධන වත්කම්වල ක්ෂය වාර්ෂිකව ලාභාලාභ ගිණුමට හර කර ක්ෂය සංචිත අරමුදල් ගිණුමට බැර කල යුතු අතර, මෙම ක්ෂය ප්‍රමාණයට අදාල මුදල් වර්ෂය සඳහා පළාත් භාණ්ඩාගාරයේ පොත් පියවීමට පෙර පොදු තැන්පත් ගිණුමට (ක්ෂය සංචිත අරමුදලට) බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරය වෙත මුදලින් යැවිය යුතු වූවත් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල (2011 - 2014 දක්වා) රු. 10,986,647 ක මුදලක් එසේ යවා නොතිබුණි. |

(iii). ප.මු.රී. 379

අත්තිකාරම් ගිණුම්වල කාරක පාඩු පියවීම සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශන වලින් ප්‍රතිපාදන සැලසිය යුතු වුවත්, එසේ කර නොතිබුණ අතර, 2014 අවසන් ගිණුම් ප්‍රකාශය තුළ 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාරක පාඩු ලෙස රු. 7,648,369 ක් දක්වා තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

----------------------------

(i). කාර්ය සාධනය

-----------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) 2014 වර්ෂය තුළ කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකය පැවැත්වූ පුහුණු පාඨමාලා 177 ක් සඳහා පුහුණුලාභීන් 10150 ක් කැඳවා තිබූ නමුත් ඉන් 8528 ක් පමණක් සහභාගී වී තිබුණි. ඒ අනුව නොපැමිණි පුහුණුලාභීන් ගණන 1622 ක් එනම් සියයට 16 ක් විය. මේ හේතුවෙන් මෙම පාඨමාලා සඳහා දැරූ ස්ථාවර පිරිවැය වන විදුලිය, ශාලා ගාස්තු, සම්පත්දායකයින්ගේ පිරිවැය, ආයතන කාර්ය මණ්ඩල වේතන යනාදියෙන් සියයට 16 ක් පමණ ඵලදායීව යොදා ගැනීමට නොහැකි වී තිබුණි. තවද වයඹ පුහුණු ආයතනය ආදායම් වශයෙන් අපේක්ෂා කල සේවා ගාස්තු, ආහාර සැපයීමේ ගාස්තු, බස් රථ ආදායම් යනාදියද මේ හේතුවෙන් අහිමි වී තිබුණි.

b) 2014 වර්ෂයේදී කිසිදු නව පුහුණු පාඨමාලාවක් වයඹ පුහුණු ආයතනය විසින් හඳුන්වා දී නොතිබූ අතර ලාභදායීව පවත්වාගෙන එනු ලැබූ පරිගණක මෘදුකාංග නිපදවා සැපයීමේ ව්‍යාපෘති 03 ක් නතර කර තිබුණි.

(ii). නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පුහුණු ආයතනය සතුව පැවති රු.1,668,125 ක් වටිනා වත්කම් 02 ක් ඌන උපයෝජිතව පැවතුණි.

**5.2.2 ව්‍යවසායකත්ව සංවර්ධන සේවා ඒකාබද්ධ අභිජනන ගොවිපල මාවතගම - ගිණුම් අංක 25002**

---------------------------------------------------------------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

---------------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i). සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් ගොවිපල කටයුතු වෙනුවෙන් රු.268,000 ක මුදලක් වැයකර තිබුණද, අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ලාභය ගණනය කිරීමේදී එම වියදම් සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ii). ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ රු.548,040 ක් වූ පොල් අලෙවි ආදායම වර්ෂයේ ආදායමක් ලෙස ජර්නල් සටහන්වල දක්වා තිබුණද එම මුදල් වර්ෂයේ ආදායමට හෝ සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(ඇ) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| i. ප.මු.රී.375(1) | අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ශුද්ධ පාඩුවක් අපේක්ෂා කරන්නේනම් එම ශුද්ධ පාඩුව කපා හැරීම සඳහා ප්‍රතිපාදන සලසා ගතයුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. |
| ii. ප.මු.රී.377(1) | ප්‍රාග්ධන වත්කම්වල අගය අඩුවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.604,478 ක මුදලක් ක්ෂය සඳහා වෙන්කර ඇතත්, එම මුදල "පොදු තැන්පත් ගිණුමේ ක්ෂය සංචිත අරමුදලට" බැර කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරයට යවා නොතිබුණි. |

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

------------------------------

මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(i). ගොවිපලේ සේවයේ නියුතු සුළු සේවකයින්ට අදාලව සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට රු. 24,900 ක මුදලක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි.

(ii). ගොවිපලේ සංවර්ධන කටයුතු රාශියක් පැවතුණද ඒවා ඉටුකර ගැනීමෙන් තොරව 2014 වර්ෂයේ ගිණුම් පියවීමේදී රු.664,834 ක මුදලක් ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණි.

**5.2.3 ගොවිපල කටයුතු මෙහෙය වීම හා බිත්තර වී සැපයීම - ගිණුම් අංක 25102**

**-------------------------------------------------------------------------------**

(අ) මූල්‍ය ප්‍රකාශන

---------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.429,306 ක් ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| i. ප.මූ.රී.377.1 | ප්‍රාග්ධන වත්කම්වල අගය අඩුවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,792,480 ක් ක්ෂය සඳහා වෙන්කර ඇතත්, එම මුදල පොදු තැන්පත් ගිණුමේ ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය වෙත මුදලින් යවා නොතිබුණි. |
| ii. ප.මූ.රී.380 | තාවකාලික ලාභාලාභ ගිණුමක් මඟින් පාඩුවක් අනාවරණය වන්නේ නම්, එය මුදල් ප්‍රකාශයේ පාඩුව සඳහා සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදනයට හර කොට අදාල |

අත්තිකාරම් ගිණුම බැර කළයුතු වුවත්. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ පාඩුව වූ රු.2,401,216 ක මුදල පසුගිය වර්ෂවල ශුද්ධ පාඩුවට එකතු කර සමුච්චිත අලාභය ලෙස රු.67,036,480 ක් ශේෂ පත්‍රයේ වගකීම්වලින් අඩුකර පෙන්වා තිබුණි.

iii. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත

වාරියපොල හා ගල්ගමුව ගොවිපලවල්වල කන්න සේවකයින් සඳහා පනත ප්‍රකාරව රු.384,048 ක් අඩුවෙන් අරමුදලට මුදල් ප්‍රේෂණය කර තිබුණි.

iv. 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

ගොවිපලවල්වල කන්න සේවකයන්ට අදාල සේවක භාරකාර අරමුදලේ දායක මුදල් රු.172,742 ක් ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

------------------------------

(i). නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) ගල්ගමුව ගොවිපලේ අක්කර 28 ක් පමණ භූමි භාගයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රියව පැවති අතර, ප්‍රදේශයට ගැලපෙන ආදායමක් ලබාගතහැකි භෝග වගා කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

b) වාරියපොල ගොවිපල භූමියේ වත්කම් වර්ග 15 ක් බොහෝ කාලයක් තිස්සේ අක්‍රියව ගරාජවල හා ගබඩාවල රඳවාගෙන තිබූ අතර, ඒවා හඳුනාගෙන ඉවත් කිරීමට හෝ පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

a) වාරියපොල ගොවිපලේ කිරිගව ව්‍යාපෘතිය සඳහා දැරූ වියදමට සාපේක්ෂව රු.203,813 ක අලාභයක් සිදුවී තිබුණි.

b) වාරියපොල ගොවිපලේ 2012 දෙසැම්බර් මාසයේදී මිලදී ගන්නා ලද රු. 150,000 ක් වටිනාකමැති මිටි මුරුංගා බීජ කිලෝග්රෑම් 5 ක් 2015 මාර්තු 27 දින වන විටත් කල් ඉකුත්වී ගබඩාවේ රඳවා තිබුණි.

c) වාරියපොල ගොවිපලේ 2013 හා 2014 වර්ෂවලදී මිලට ගත් බටු හා උදු බීජ අලෙවි කිරීමට නොහැකිවීම හා කල් ඉකුත්වීම හේතුවෙන් රු.123,022 ක අලාභයක් සිදුවී තිබුණි.

d) වාරියපොල ගොවිපලේ 2013 හා 2014 වර්ෂවල දඹල වගාව හා රටකජු වගාව සඳහා දැරූ වියදමට සාපේක්ෂව රු.77,653 ක අලාභයක් සිදුවී තිබුණි.

**5.3 ප්‍රමාද වී ලැබුණු වාණිජ අත්තිකාරම් ගිණුම්**

-----------------------------------------------

**5.3.1 පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අමුද්‍රව්‍ය සැපයීම ඇතුළු පේෂ කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය - 22302 - 2012 වර්ෂය**

------------------------------------------------------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන

-----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i). 2010 වර්ෂයේදී මිළදී ගන්නා ලද ලොරි රථයේ රු.4,040,284 ක් වූ පිරිවැය, ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් යටතේ වාර්තා කර නොතිබුණු අතර, ලොරි රථයේ වාර්ෂික ක්ෂයවීම්ද වාණිජ අත්තිකාරම් ගිණුමට ගැලපුම් කර නොතිබුණි.

(ii). 1998 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන රු.80,522 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේදීද අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

ජංගම වගකීම් යටතේ දක්වා තිබූ වැඩිපුර අය වීම් සහ ද්වි ගණන දෝෂ ලෙස දක්වා තිබුණ රු.474,181 ක් වූ ගිණුම් ශේෂයන් 02 ක් 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ දුර්වලතා

-----------------------------

ණයගැති පාලනය

---------------------

1998 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින රු.9,143,540 ක් වූ ණය අය කර ගැනීමට කළමණාකාරීත්වය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණු අතර ණය අය වීමේ අවදානම පිළිබඳ සැලකිල්ලට ගෙන වාර්ෂිකව බොල් ණය සඳහා ප්‍රතිපාදන සැලසීමක්ද සිදුකර නොතිබුණි.

**5.3.2 කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අමුද්‍රව්‍ය සැපයීම ඇතුලුව කාර්මික වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම - 22402 - 2012 වර්ෂය**

**----------------------------------------------------------------------------------------------------------**

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) ගිණුම්කරන අඩුපාඩු

-----------------------

(i). වාණිජ අත්තිකාරම් ගිණුමට අදාලව රු.229,274 ක වියදම් දෙපාර්තමේන්තු සම්මත ගිණුමෙන් දරා තිබුණි.

(ii). පුනරාවර්ථන වියදම් ලෙස දරන ලද රු.196,576 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii). වසර 10 ඉක්මවූ රු.1,195,906 ක ණය ගැති වටිනාකම ශේෂ පත්‍රයේ දක්වා තිබුණද මෙම ණය අයවීමේ අවධානම සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් පරිදි අඩමාන ණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

රු.27,525,315 ක වත්කම් ගිණුම් ශේෂ 04 ක් හිමිකම් ඔප්පු, පැවරුම් ලියකියවිලි, ස්ථාවර වත්කම් ලේඛණ හා ශේෂය සැදුම්ලත් ආකාර දැක්වෙන උපලේඛන යනාදී විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කල නොහැකි විය.

**5.3.3 කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්මික පාසැල් පවත්වාගෙන යාම පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම - 22403 - 2012 වර්ෂය**

---------------------------------------------------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන

----------------

තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). කල් ඉකුත් වී ඇති ණය සඳහා බොල් හා අඩමාන ණය වෙන් කිරීමට පහසුවන අයුරින් ණය ගැති කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණු අතර එසේ කල් ඉකුත් වූ ණය සඳහා බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii). අත්තිකාරම් ගිණුමෙන් දැරිය යුතු රු.229,906 ක් වූ විදුලිය, ජල, දුරකථන හා වරිපනම් බදු වැනි වියදම් දෙපාර්තමේන්තු වැය විෂයෙන් දරා තිබුණි.

(iii). සමාලෝචිත වර්ෂය තුල යන්ත්‍ර සහ ගොඩනැඟිලි අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවා තිබුණු රු.1,047,844 ක් වන පුනරාවර්තන වියදම්, මූලධන වියදම් ලෙස ගණුම්ගත කර තිබුණි.

(iv). අත්තිකාරම් ගිණුම් කාර්යය යටතට වැටෙන පුහුණු මධ්‍යස්ථාන 30 ක භාරකරුවන්ගේ ඇප මුදල් හා ඒවායේ ආයෝජන පිළිබඳ තොරතුරු ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

රු.14,769,926 ක් වූ වත්කම් හා වගකීම් ගිණුම් ශේෂ 09 ක් සඳහා නියමිත ලේඛණ, සමීක්ෂණ වාර්තා, ශේෂය සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන, පාලන ගිණුම් සහ ශේෂ සනාථ කිරීම්යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කල නොහැකි විය.

(ඇ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (i). පළාත් මූල්‍ය රීති 375.1 | අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අපේක්ෂිත කාරක පාඩුව පියවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii). පළාත් මූල්‍ය රීති 377.1 | ස්ථාවර වත්කම් වාර්ෂික ක්ෂය කිරීමත්, එම ක්ෂය වටිනාකම සංචිත අරමුදල් ගිණුමකට බැර කිරීමත්, එම මුදල් වත්කමක් වශයෙන් ශේෂ පත්‍රයේ පෙන්වීමත් සිදුකර නොතිබුණි. |

## 6. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 6.1 කාර්ය සාධනය

---------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වයඹ පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක් පැවතුණද දෙපාර්තමේන්තුවේ සේවයකල ප්‍රජා සෞඛ්‍ය සහකාර වෛද්‍ය නිලධාරීන් 47 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා ගැනීම හේතුවෙන් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 24 දෙනෙකු පමණක් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවා තිබීම නිසා පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජංගම සේවා ගුණාත්මක මට්ටමින් ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ප්‍රජා සෞඛ්‍ය සේවා සායන හා වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ඇස්තමේන්තුගත හා තථ්‍ය සංඛ්‍යා ලේඛණ අනුව සායන හා වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය සියයට 32 ක් පමණ විය. මාසිකව පැවැත්විය යුතු ආහාර හා පෝෂණ වැඩසටහන්, බෝ නොවන රෝග නිවාරණ වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, ඔසු වගා වැඩසටහන්, සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් යනාදිය සඳහා ජංගම සායන පැවැත්වීමට ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් අඩු අවධානයක් යොමුකර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද ඖෂධ වර්ග 14 ක් සැලකිල්ලට ගත්විට, නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය මෙන් සියයට 04 සිට සියයට 450 දක්වා වූ ප්‍රමාණයක් පිටතින් මිලදී ගෙන තිබූ අතර, ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් නොමැති වීම නිසා ඖෂධ වර්ග අවශ්‍ය ප්‍රමාණය ආයුර්වේද දෙපාර්තමේන්තුව තුල නිෂ්පාදනය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) කුරුණෑගල සමූපකාර සංවර්ධන උපකාර්යාලය, සමූපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කොට්ඨාශ 13 කින් හා ලියාපදිංචි සමිති 1054 කින් සමන්විත වන බව නිරීක්ෂණය වූ අතර, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරණ සමූපකාර සමිති පනතේ (viii) වන පරිච්ඡේදයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ක්‍රියාකාරී සමූපකාර සමිති 623 කින් සමූපකාර සමිති 122 ක 2014 වර්ෂයේදී විගණනයක් සිදුකර නොතිබුණි. 2014 වර්ෂයේදී විගණනයන් 854 ක් ආයතනය විසින් සිදු කර තිබුණද, එම බොහොමයක් විගණනයන් 2009, 2010, 2011, 2012 කාල පරිච්ඡේදයන්ට අදාල විය. ගිණුම් ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් සමූපකාර සමිති 18 ක එම සමිති ආරම්භයේ සිටම විගණනයක් සිදුකර නොතිබුණි. සමිති 73 ක පමණ 2010, 2011 හෝ 2012 වර්ෂයට පසු විගණනයක් සිදුකර නොතිබුණි.

(ඉ) වයඹ පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් කුරුණෑගල, කුලියාපිටිය හා හලාවත යන උපකාර්යාලවල ඈවර කිරීමට තිබුණු සමිති සංඛ්‍යාව 386 න් 108 ක් පමණක් ඈවර කර තිබුණු අතර, කාර්යය මණ්ඩලයේ හිඟකම, ඈවරකිරීමට ලක්වූ සමිතියක අදාල නිලධාරීන් සොයා ගැනීමට නොහැකි වීම, පොත් පත් සොයා ගැනීමේ දුෂ්කරතාවය, ණයකරුවන් සොයාගැනීමේ අපහසුව, තක්සේරු කිරීමේ අපහසුව හා විකිණීමට ඇති බාධා යන කරුණු හේතුවෙන් ඈවර කටයුතු අවසන් නොකරන ලද සමිති සංඛ්‍යාව 278 ක් විය.

(ඊ) අරමුණු කරා ළඟා නොවීම

----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අරමුණු ඉටුකිරීමෙහිලා ඍජුව සම්බන්ධවන අවස්ථා 09 කට අදාල එකතුව රු.3,280,087 ක විවිධ වියදම් විසර්ජන ගිණුමෙන් දරාතිබුණු බැවින් වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ප්‍රතිපාදන වෙන්කල අරමුණු ඉටු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii). කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව එක් වඩු කාර්මික පාසලක් විසින් අවම වශයෙන් රු. ලක්ෂ 03 ක ඇණවුම් ඉටු කල යුතු වුවද, වඩු කාර්මික පාසැල් 06 ක් එකම ඇණවුමක්වත් ඉටු කර නොතිබුණි.

(iii). කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2013 - 2017 පස් අවුරුදු සැලැස්මට අනුව 2014 වර්ෂය සඳහා සිසුන් 1196 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, 2014 වර්ෂය සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 640 ක් විය. ඉන් සහතික ලබා පිටව ගිය සංඛ්‍යාව 78 ක් විය.

(iv). සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් වාර්ෂික ඇස්තමේන්තු ලේඛණය අනුව, ග්‍රාම සංවර්ධන වැඩසටහනේ පානීය ජල ව්‍යාපෘති 21 ක, ග්‍රාමීය අතුරු මාර්ග 17 ක සහ ප්‍රජා ශාලා 07 ක ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.

## 6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් නොකරන ලද ආණ්ඩුකාර නිළ නිවසේ භාවිතයේ තිබුණු කැටයම් සහිත තේක්ක ඇඳක් හා ද්විත්ව ඇඳන් 02 ක් ඇතුළුව ඇඳන් 03 ක් එම විෂයයට අදාල ආයතන නිළධාරීන් හා විගණන නිළධාරීන් විසින් කරන ලද භෞතික පරීක්ෂාවට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් වළකුඹුර මැටි මධ්‍යස්ථානය සඳහා 2013 විශේෂ ව්‍යාපෘති යටතේ රු.1,485,000 ක් වැය කර මිලදීගෙන තිබුණු ජංගම විදුලි උදුන සඳහා තාක්ෂණික පිරිවිතරය අනුව වසර 02 ක වගකීම් සහතිකයක් ලබා ගත යුතු විය. 2014 ජනවාරි 12 දින අත්සන් කරන ලද සේවා ගිවිසුම අනුව වගකීම් සහතිකය වසරක කාලයක් සඳහා ලබා ගෙන තිබුණු අතර, උදුන කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට ලැබී තිබුණේ 2014 අප්‍රේල් මස බැවින් උදුනේ වගකීම් කාලය මාස 08 කට සීමාවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ග්‍රාම නිලධාරී වසම් 5 ක අයදුම්කරුවන් 527 දෙනෙකු ඉඩම් කොමසාරිස් 157 ලේඛනයේ ලියාපදිංචි වී බලපත්‍රයක් නොමැතිව රජයේ ඉඩම් භුක්ති විඳිමින් සිටින නමුත්, සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් හට බලපත්‍ර ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) සඳලංකාව දිස්ත්‍රික් රෝහලේ ප්‍රධාන රසායනාගාරයේ භාවිතා කරන Centrituge නමැති උපකරණය ක්‍රියා විරහිතවීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට රෝගී පරීක්ෂණ (Serum Cholesterol) නැවතී තිබුණි.

(ඉ) උපකරණ අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් නියමිත වේලාවට නොලැබීම හේතුවෙන් ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයට ලැබුණු උපකරණ 72 ක් අළුත්වැඩියා කිරීමට නොහැකිව තිබුණි.

(ඊ) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ බෝ නොවන රෝග ඒකකයට අයත් "සුවතා පියස" ශරීර යෝග්‍යතා මධ්‍යස්ථායේ වටිනාකම රු.1,835,535 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විධිමත්ව පත් නොවූ උපදේශකවරයෙකු භාරයේ පැවතුණි.

(උ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් වකුගඩු රෝගීන් සඳහා පිරිසිදු ජලය ලබාදීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු රු.1,246,000 ක් වටිනාකමැති රතු මැටි පෙරන 500 කින් රතු මැටි පෙරන 144 ක් නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. මෙසේ මිලට ගෙන තිබූ රතු මැටි පෙරනයන්වල පහත සඳහන් දෝෂයන් පවතින බව නිරීක්ෂණය විය.

(I). පෙරන භාවිතා කිරීමේදී එහි බිත්තිය කුඩා කොටස්වලට කැඩී යන බව
(II). මැටි පෙරනයේ කුඩා මැටි අංශු ජලය සමඟ දියවී යන බව
(III). එම අංශු ප්ලාස්ටික් භාජනයේ යට කොටසේ තැන්පත් වන බව
(IV). ජල පෙරනයේ වේගය පැයකට එක් ලීටරයක් වන බැවින් පවුලේ සාමාජිකයන් වැඩි සංඛ්‍යාවක් සිටින පවුල් සඳහා පෙරනය ප්‍රමාණවත් නොවන බව
(V). ඒ සඳහා විවෘත වෙළඳපලේ අමතර කොටස් නොමැති බව
(VI). ජල කරාමය නිසි ප්‍රමිතියෙන් නොතිබීම හේතුවෙන් සමහර කරාම මඟින් ජලය කාන්දු වන බව

(ඌ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 26 ක් වැය කර ඉදිකර තිබුණු ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු ඒකක සම්බන්ධව සිදුකල භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු පවතින බව නිරීක්ෂණය විය.

(I). ජල පිරිපහදු ප්ලාස්ටික් ටැංකි ඍජුවම හිරු එළියට ආවරණය වන පරිදි සකස්කර තිබූ බව

(II). ප්‍රධාන ජල කරාමය හා අනිකුත් සෙසු කරාම සඳහා අගුල් දැමීමට පහසුකම් සලසා නොතිබුණු බව
(III). වල් අලි තර්ජන පවතින ප්‍රදේශවල මේවා ස්ථානගත කර තිබූ බව
(IV). විදුලි වැටක් හෝ ආරක්ෂිත වැටක් මේ සඳහා ඉදිකිරීමට කටයුතු කර නොතිබූ බව
(V). ජල පද්ධතියේ යෙදවුමෙන් සියයට 50 ක් පමණ ජලය නාස්ති වන බව
(VI). ජල නාස්තිය නිසා නියං කාලවලදී ජලය හිඟවීම වැළැක්විය නොහැකි බව

(එ) වයඹ ප්‍රධාන අමාත්‍යාංශය මඟින් 2014 වර්ෂයේ උපමාන පාදක ප්‍රතිපාදන යටතේ රු. 21,468,948 ක් වැය කර ග්‍රාමීය ප්‍රජා මට්ටමේ ස්වේච්ඡා සංවිධාන වලට බෙදා හැරීම සඳහා ප්ලාස්ටික් පුටු 15,000 ක්, සාස්පාන් කට්ටල 200 ක්, ශබ්ද විකාශන කට්ටල 50 ක්, වානේ කබඩ් 200 ක් හා ඇස්බැස්ටෝස් ෂීට් 1324 ක් මිලදී ගෙන තිබුණි. මෙම භාණ්ඩ මිලදි ගැනීම, බෙදා හැරීම හා ගබඩා කිරීම සම්බන්ධයෙන් අඩුපාඩු ගණනාවක් පැවති බව ඒ පිළිබඳව සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i). රු. 4,625,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු ප්ලාස්ටික් පුටු 5000 ක් බෙදාහැරීම පිළිබඳ සිදුකල නියැදි පරීක්ෂාවේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඩු ආදායම් සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් සඳහා ප්ලාස්ටික් පුටු කිසිවක් ලබාදී නොතිබුණු බවත් පඬුවස්නුවර බටහිර හා නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා පමණක් මිලදී ගෙන තිබුණු පුටුවලින් සියයට 56 ක් ලබාදී ඇති බවත් නිරීක්ෂණය විය.

(ii). 2014 වර්ෂයේ උපමාන පාදක යටතේ මිළදීගත් රු. 21,468,948 ක් වටිනා භාණ්ඩ වලින් විගණනයට ඉදිරිපත් වූ බෙදාහැරීමේ ලේඛණයේ පරිදි රු. 685,763 ක වටිනාකම වූ භාණ්ඩ අදාල පාර්ශවයන් විසින් හොඳ තත්ත්වයෙන් භාරගත් බවට සඳහන්ව තිබුණද අදාල භාණ්ඩ නියමිත පාර්ශවයන්ට ලබාදී නොතිබුණු බව විගණනය විසින් සිදුකල ස්ථානීය පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(iii). විගණනයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ බෙදා හැරීමේ ලේඛණයෙන් තෝරාගත් අවස්ථා 21 ක් භෞතික පරීක්ෂාවට භාජනය කල අතර, රු. 701,634 ක වටිනාකමැති භාණ්ඩ වර්ග 04 ක් සම්බන්ධයෙන් බෙදාහැරීමේ ලේඛණයේ පැවති අත්සන් හා නිල මුද්‍රා අදාල සමිතියේ / ආයතනයේ/ පුද්ගලයින්ගේ අත්සන් හා නිල මුද්‍රා සමඟ නොගැලපුණු බව නිරීක්ෂණය විය.

(iv) රු. 436,900 ක් වටිනා සෙවිලි තහඩු 289 ක් පුද්ගලයින් 10 දෙනෙකු වෙත නිකුත් කර තිබූ බව වාර්තා කර තිබුණද, අදාල පාර්ශවයන් එම ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ ඡන්දහිමි නාම ලේඛණයේ ඇතුලත් ඡන්ද දායකයෙකු නොවන අය බව නිරීක්ෂණය විය.

(v) තෝරාගත් එක් සමිතියක් සඳහා පමණක් රු.739,000 ක වටිනාකමැති ප්ලාස්ටික් පුටු 600 ක් හා වානේ අල්මාරි 16 ක් ලබාදී තිබුණි.

(ඒ) ඉඩම් අත්පත්කරගැනීමේ පනත අනුව රජයේ අවශ්‍යතාවයන් සඳහා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ දී භුක්තිය භාරගත් දිනයේ දීම තක්සේරු වටිනාකම ගෙවිය යුතු අතර, ගෙවීම් ප්‍රමාද වන සෑම අවස්ථාවකදීම වන්දි මුදල් ගෙවන දින දක්වා වූ කාලපරිච්ඡේදයට සියයට 7 ක වාර්ෂික පොළී මුදලක් ගෙවිය යුතු විය. ඒ අනුව මූලික පිඹුරු අංක 4484 යටතේ ඉඩම් කැබලි 06 ක වන්දි ගෙවීම් ප්‍රමාද වීම නිසා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,101,484 ක පොළී මුදලක් ගෙවා තිබුණි.

## 6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) නිකවැරටිය මූලික රෝහලේ සහ සඳලංකාව දිසා රෝහලේ 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ විෂයයන් 301 කින් ඒකක 731,225 ක අතිරික්තතා හා භාණ්ඩ විෂයයන් 315 කින් ඒකක 291,784 ක ඌනතා සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය වනවිට වයඹ පළාතේ පාසල් 126ක් වසා දැමීමට කටයුතු කර තිබූ අතර එයින් 72 ක් ප්‍රාදේශීය ලේකම්වරයාට භාරදී තිබුණද ඉතිරි පාසැල් 54 භාර දී නොතිබුණි. වසා දැමූ පාසල් වලින් කුරුණෑගල අධ්‍යාපන කලාපයේ 21 ක්ද, කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ 22 ක්ද, ඉබ්බාගමුව අධ්‍යාපන කලාපයේ 07 ක්ද, හලාවත අධ්‍යාපන කලාපයේ 02 ක්ද, පුත්තලම අධ්‍යාපන කලාපයේ 07 ක්ද කිසිදු කටයුත්තකට යොදා ගෙන නොතිබුණි.

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 295 ක් පැවති අතර, ඉන් නිල නිවාස 60 ක පමණක් නිලධාරින් පදිංචි වී සිටි අතර නිවාස 107 ක් අබලන් තත්ත්වයේ පැවතුනද, යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් 2009,2013 හා 2014 වර්ෂවල මිලදී ගනු ලැබූ ක්‍රීඩා භාණ්ඩ ඒකක 1392 ක් බෙදා දී නොතිබුණි.

(ඉ) පෞද්ගලික විභාග රජයේ පාසල්වල පැවැත්වීමේ ක්‍රමවේදය හා ගාස්තු අයවීම පිළිබඳ පරීක්ෂාවේදී වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විභාග ශාලා සඳහා ගාස්තු අය කිරීමේදී යොදාගත යුතු ක්‍රමවත් පදනමක් හඳුන්වා දී නොතිබුණි. එසේම පෞද්ගලික ආයතන රජයේ පාසල්වල විභාග පැවැත්වීමේදී අදාල විභාගය පැවැත්වීමට පෙර ශාලා ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් නොවීම හේතුවෙන් ශාලා ගාස්තු අයවීමේ ප්‍රමාදයන් හා අය නොවීම් නිරීක්ෂණය විය.

(ඊ) නිකවැරටිය කලාප කාර්යාලයේ වසර 06 කට අධික කාලයකට පෙර ලැබී තිබුණු ගුරු අත්පොත් 1603 ක් නිසි පරිදි බෙදා හැරීමට කටයුතු කර නොතිබුණු අතර, ඒවා අනාරක්ෂිතව ගබඩා කිරීම හේතුවෙන් විනාශයට පත්වෙමින් තිබූ බව නිරීක්ෂණය විය.

(උ) නිකවැරටිය, ගිරිඋල්ල, ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලවල ගුරුවරුන් 27 දෙනෙකු ගණිතය විෂයය අසමත්වීම, ප්‍රතිඵල සනාථ නොවීම, අදාල තොරතුරු පළාත් අධ්‍යාපන කාර්යාලයට යොමු කර ඇතත් පිළිතුරු ලැබී නොමැතිවීම, සුදුසුකම් සම්පූර්ණ නොවීම හා ලිපිගොනු අස්ථානගතවීම යනාදි කරුණු හේතුවෙන් ස්ථිර කර නොතිබුණි. ඒ අනුව ගුරුවරුන් බඳවා ගැනීමේදී නිසි පරිදි නියමිත සුදුසුකම් සපුරා තිබුණේදැයි පරීක්ෂා කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දඹදෙණිය මූලික රෝහලට විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අවස්ථා දෙකකදී දැරීමට සිදු වූ පිරිවැය හා තෙවන වර මිලදී ගැනීමේදී මිල වැඩි වීම සලකා බැලීමේදී ආයතනයට සිදු වූ මූල්‍යමය පාඩුව දළ වශයෙන් රු.449,824 ක් පමණ වී තිබුණි.

(ආ) පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් එකවර නූල් කිලෝ 60 ක් වියලිය හැකි නූල් වියලීමේ යන්ත්‍රයක් මිළදී ගැනීමට තීරණය කර තිබුණද, මිළදී ගෙන තිබුණේ කිලෝ 12 ½ ක් වියලිය හැකි යන්ත්‍රයක් විය. එයින් දිනකට නූල් වියලීම කල හැක්කේ හතර වතාවක් පමණක් බැවින් දිනකට වියලිය හැකි නූල් ප්‍රමාණය කිලෝ 50 කට සීමාවී තිබුණි. එබැවින් දිනකට තම්බනු ලබන නූල් කිලෝ 100 කින් ඉතිරි කිලෝ 50 සාමාන්‍ය පරිදි ස්වභාවිකවම වියලීම සිදු කරන නිසා දරන ලද වියදමට සාපේක්ෂව කාර්යක්ෂමතාවයක් ආයතනයට ලැබී නොතිබුණි.

(ඈ) වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් කිහිපයක පැවති අබලන් ඩෙස් පුටු වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය හරහා අලුත්වැඩියා කිරීමේ කටයුතු කර තිබුණි. එහෙත් පළාත් මූල්‍ය රීති අනුව නිසි ඊර්ටරයක් හා නිසි පිරිවිතරයන් ඉදිරිපත් නොකර වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් උපකරණයේ සියලු කොටස් අලුත්වැඩියා නොකර කොටසක් පමණක් අලුත්වැඩියා කර තිබුණි. එක් එක් අලුත්වැඩියාවේ ස්වභාවය අනුව ගෙවීම් නොකර සම්පූර්ණ අලුත්වැඩියාවම කලා සේ සලකා රු. 4,213,536 ක මුදලක් වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ගෙවා තිබුණි.

## 6.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

| ආයතනයේ නම | වත්කම් ගණන | වටිනාකම | අක්‍රියව තබා ඇති කාලය |
|---|---|---|---|
| | | රු. | |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | ඖෂධ, ශල්‍ය වෛද්‍ය උපකරණ, පාරිභෝජ්‍ය තොග වර්ග 253 | 11,974,316 | - |
| | වාහන 01 | - | වසර 01 යි |
| පුත්තලම් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | ඖෂධ (Sodium Do Vide) | 49,857 | - |
| | වාහන 08 | - | - |
| කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | වාහන 21 | - | - |
| රිදීගම රෝහල | පරිගණක මෘදුකාංග පද්ධතිය | 188,000 | වසර 1 ½ යි |
| මාවතගම රෝහල | Bio Chemistry Analizer | 312,500 | - |
| සඳලංකාව දිස්ත්‍රික් රෝහල | Cardiac Defibrillator | - | වසර 02 යි |
| නිකවැරටිය මූලික රෝහල | වායු සමීකරණය | - | මාස 03 යි |
| නාරම්මල ආයුර්වේද රෝහල | අභ්‍යන්තර දුරකථන පද්ධතිය | - | වසර 02 යි |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | ගිලන් රථය | - | වසර 1 ½ යි |
| වෙන්නප්පුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | වාහන 01 | - | වසර 05 යි |
| ප්‍රධාන අමාත්‍යාංශය | වාහන 01 | - | වසර 01 යි |
| සමාජ සුභසාධන අමාත්‍යාංශය | වතුර පිල්ටර් 14 | - | වසර 01 යි |
| | කබඩ් 03 | - | වසර 1 ½ යි |
| | වයිට් බෝඩ් 33 | - | වසර 1 ½ යි |
| පරිවාස හා ළමා රක්ෂක | පරිගණක උපාංග කට්ටල 02 | - | - |

| | | | |
|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | මැෂින් 14 | | |
| | ප්‍රින්ටර් 05 | | |
| | පෙන්ඩ්‍රයිව් 02 | | |
| | බ්‍රීෆ් කේස් 02 | | |
| | විදුලි පංකා 05 | | |
| පේෂකර්ම දෙපාර්තමේන්තුව | වාහන 01 | - | - |
| කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | විදුලි පෝරනුව 01 | 528,500 | වසර 01 යි |
| | පුහුණු මධ්‍යස්ථාන 09 | - | - |

කුලියාපිටිය රෝහලේ සායනික අපද්‍රව්‍ය පිලිස්සීම සඳහා 2011 වර්ෂයේ රු.1,246,257 ක් වැයකර රෝහලේ පස් මහල් ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ඉදිකර ඇති දාහකය (Incinerator) ගොඩනැගිල්ලේ පැවැත්මට හානියක් වීම පාරිසරික බලපෑම් යන හේතුමත 2012 වර්ෂයේ දින 14 ක් පමණක් අපද්‍රව්‍ය පිලිස්සීමෙන් පසු එම කටයුතු නතර කර තිබුණි.

6.6 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2014 වර්ෂයේ පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා සඳහා ජංගම දුරකථනයක් මිලදී ගැනීමට රු.113,490 ක් වියදම් කර තිබුණි.

(ආ) 2014 ජුලි 18 දින පැවැති මාධ්‍ය සාකච්ඡාවක් සඳහා සහභාගිවූ වයඹ පළාත් සභාවේ මාධ්‍යවේදීන් 59 දෙනෙකුට හා කාර්ය මණ්ඩලයට ආහාර සැපයීම වෙනුවෙන් සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් රු.112,250 ක මුදලක් වැය කර තිබුණි.

(ඇ) අමාත්‍යාවරයාගේ පෞද්ගලික අවශ්‍යතාවය සඳහා අළුත් අවුරුදු සුභ පැතුම්පත් මුද්‍රණය කරවා ගැනීම, එය තැපැල් කිරීම සඳහා මුද්දර ලබාගැනීම සහ දැයට කිරුල විශේෂ ගුවන් විදුලි විකාශනයේ අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය විකාශනය කිරීම සඳහා සමාජ සුභසාධන අමාත්‍යාංශ අරමුදලින් රු.65,820 ක් වැය කර තිබුණි.

(ඈ) හලාවත ආනන්ද ජාතික පාසැලට පත්කර තිබුණු විදුහල්පතිවරු සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්ත්වය නොවිසඳීම නිසා විදුහල්පතිවරු දෙදෙනෙකු මාස තුනකට අධික කාලයක් කලාප කාර්යාලයට වාර්තා කර තිබූ අතර ඔවුන්ට රු.320,070 ක වැටුප් නිශ්කාර්යව ගෙවා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගුරු සේවයේ I පංතියේ නිලධාරියෙකු සාම අධ්‍යාපන ගුරු උපදේශකවරයකු වශයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණද, එම නිලධාරියාට දෙපාර්තමේන්තු කාර්යාලය තුළ ඉටුකල යුතු කාර්යයන් කිසිවක් නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය වූ අතර 2012 මාර්තු සිට 2015 මැයි දක්වා වැටුප් වශයෙන් රු.1,635,454 ක් ගෙවා තිබුණි.

6.7 **හඳුනා ගන්නා ලද පාඩු**

**------------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව හා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කල වෙන්නප්පුව හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන ආදායම හා වියදම සලකා බැලීමේදී දෙපාර්තමේන්තුවට රු.966,345 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) රිදීගම දිස්ත්‍රික් රෝහලේ 2012 හා 2013 වර්ෂවල කල් ඉකුත්ව ඇති වටිනාකම රු.55,945 ක් වූ තොග ඒකක 45,862 ක් විනාශ කර පොත්වලින් කපා හැරීමට තීරණය කර තිබූ අතර, අතිරික්ත බෙහෙත් තොග වෙනත් රෝහල් අවශ්‍යතා සඳහා ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාවතගම දිස්ත්‍රික් රෝහලේ 2012 වර්ෂයේ ගබඩා සමීක්ෂණයේදී අනාවරණය වූ වටිනාකම රු.41,942 ක් වූ කල් ඉකුත් වූ ඖෂධ තොගයක් විනාශ කිරීමට කටයුතු කර තිබුණි.

(ඈ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ගිලන්රථයේ රක්ෂණය කල් ඉකුත් වීමට පෙර අළුත්කරවා නොගැනීම හේතුවෙන් එම රථය අනතුරට පත්වීමෙන් සිදු වූ රු.203,800 ක අලාභය රජයට දැරීමට සිදු වී තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ සිදු වූ අනතුරු 04 ක් හේතුවෙන් රියදුරු මහතුන්ගෙන් අයවීමට ඇති අලාභය රු.208,420 ක් වන අතර එම මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් අයකරගෙන නොතිබුණි.

(ඊ) නාරම්මල ආයුර්වේද රෝහලේ ඖෂධ ගබඩාව සම්බන්ධයෙන් 2014 අගොස්තු 11 දින සිදුකල භෞතික විගණන පරීක්ෂාවේදී අරවින්ද ආසවය බෝතල් 14 ක්, කට්පලාදි චූර්ණය කි.ග්‍රෑ 04 යි ග්‍රෑ 500 ක් හා සීනි කි.ග්‍රෑ 08 ක් කල් ඉකුත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(උ) ගොඩවෙල ජනසළු මධ්‍යස්ථානයේ 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.2,625,554 ක මුදල් හා තොග ඌනතාවය එවකට ස්ථාන භාර නිළධාරී ලෙස කටයුතු කල පේෂකර්ම උපදේශිකාවගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොඩවෙල නූල් ගබඩාවේ අනිසි ලෙස තොග පරිහරණය කිරීම, තොග පොතේ ශේෂ අයථා ලෙස සටහන් කිරීම හා නූල් තොග සඟවා තිබීම මත අයකර ගත යුතු රු.595,031 ක මුදල හා නූල් ගබඩාවේ උපකරණ තොග අනිසි පරිහරණයට ගෙන තිබීම මත උපදේශිකාවගෙන් අය කර ගැනීමට තීරණය කර තිබූ රු.192,826 ක මුදල අදාල පේෂකර්ම උපදේශිකාවගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

**6.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**----------------------------------**

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) රිදීගම, වාරියපොල, මහව, කුලියාපිටිය යන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලින් ඉටුකර තිබුණු මහින්දෝදය ගුරු විවේකාගාර සඳහා Wide ramp නම් වූ වැඩ විෂයය ඇස්තමේන්තු කිරීමේදී අඩි සහ අඟල් වලින් දක්වා තිබුණු ඒකකයන් මීටර බවට පරිවර්තනය නොකිරීම නිසා පාසල් 20 ක අදාල ඇස්තමේන්තුගත මුදල රු.3,893,036 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) පනාදරගම පුහුණු පාසලේ පරිගණකාගාර ගොඩනැගිල්ලට අදාලව මල ප්‍රවාහන පද්ධතිය පිරිසිදු කිරීමේ කටයුතු පහසු කර ගැනීම සඳහා තැබිය යුතු මනුබිල - man hok පිළිබඳ නියමිත පරිදි වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සැලසුම් නොකිරීම නිසා වටිනාකම රු. 59,856 ක් වූ අතිරේඛ වැඩ විෂයයක් හඳුන්වා දීමට සිදුවී තිබුණි.

**6.9 ප්‍රමාද වූ ව්‍යාපෘති**

මළල ක්‍රීඩා විශේෂ ව්‍යාපෘතියක් සඳහා 2013 අගෝස්තු 21 දින රේඛීය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.1,000,000 ක ප්‍රතිපාදන මුදල් ලබා දී තිබුණු අතර, එමඟින් 2013 හා 2014 වර්ෂ සඳහා පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවල පිළිවෙලින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 40 දෙනෙකු හා 50 දෙනෙකු බැගින් අඛණ්ඩව මාස 05 ක් පුහුණු කිරීම සඳහා ව්‍යාපෘති පිළියෙල කර තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාවට නංවා නොතිබුණි.

**6.10 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්, දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මාවතගම දිස්ත්‍රික් රෝහල පිහිටි ඉඩම හා සඳලංකාව දිස්ත්‍රික් රෝහල පිහිටි ඉඩම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂය අවසාන වන විටද ආයුර්වේද රෝහල් 09 ක් හා මධ්‍යම බෙහෙත් ශාලා 18 ක් පිහිටි ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණු අතර එම රෝහල් හා බෙහෙත් ශාලා ගොඩනැගිලිවල අළුත්වැඩියා හා සංවර්ධන කටයුතු සිදු කිරීමට එය බාධාවක් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ වටිනාකම රු.මිලියන 30 ක් වූ අක්කර 05 යි රූඩ් 03, පර්චස් 04 ක් වූ ඉඩමේ අටමුනේ ග්‍රාම සංවර්ධන පුහුණු ආයතනය පවත්වාගෙන යමින් තිබුණද එම වත්කම අත්පත්කරගෙන නොතිබුණි.

**6.11 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කලාප කාර්යාල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,463 | 1,368 | 95 | - |
| තෘතීය මට්ටම | 554 | 408 | 146 | - |
| ද්වීතියික මට්ටම | 9,500 | 7,203 | 2,297 | - |
| ප්‍රාථමික මට්ටම | 4,535 | 4,126 | 409 | - |
| වෙනත් | - | 101 | - | 101 |
| එකතුව | 16,052 | 13,206 | 2,947 | 101 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය (කලාප කාර්යාල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පති | 1,915 | 1,231 | 684 |
| ගුරුභවතුන් | 26,383 | 22,890 | 3,493 |
| සුළු සේවක | 2,563 | 1,937 | 626 |
| වෙනත් | 638 | 473 | 165 |
| එකතුව | 31,499 | 26,531 | 4,968 |

(ඇ) අමාත්‍ය මණ්ඩල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පෞද්ගලික ලේකම් | 06 | 08 | - | 02 |
| සම්බන්ධීකරණ ලේකම් | 08 | 09 | - | 01 |
| මාධ්‍ය ලේකම් | 05 | 06 | - | 01 |
| මහජන සම්බන්ධතා නිලධාරි | 06 | 05 | 01 | - |
| පෞද්ගලික සහකාර | 06 | 06 | - | - |
| කළමනාකරණ සහකාර | 16 | 15 | 01 | - |
| කාර්යාල කාර්ය සහයක | 12 | 16 | - | 04 |
| වෙනත් (රියදුරු) | 24 | 187 | - | 163 |
| එකතුව | 83 | 252 | 02 | 171 |

(ඇ) පළාත් පාලන කාර්ය මණ්ඩලය (පළාත් සභා)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 20 | 8 | - |
| තෘතීය මට්ටම | 47 | 19 | 28 | - |
| ද්විතියික මට්ටම | 1,227 | 1,289 | - | 62 |
| ප්‍රාථමික මට්ටම | 2,535 | 3,010 | - | 475 |
| වෙනත් | - | 387 | - | 387 |
| එකතුව | 3,837 | 4,725 | 36 | 924 |

(ඉ) ව්‍යවස්ථාපිත ආයතන කාර්ය මණ්ඩලය(පළාත් සභා)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 10 | 10 | - |
| තෘතීය මට්ටම | 23 | 08 | 15 | - |
| ද්විතියික මට්ටම | 174 | 148 | 26 | - |
| ප්‍රාථමික මට්ටම | 256 | 218 | 38 | - |
| වෙනත් | - | 51 | - | 51 |
| එකතුව | 473 | 435 | 89 | 51 |

**6.11.1 පළාත් සභා අධ්‍යාපන හා සෞඛ්‍ය හැර අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලය පිළිබඳ නිරීක්ෂණ**

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2013 වර්ෂයේ රජයේ ආයතනවලට උපාධිධාරීන් අනුයුක්ත කිරීමේ වැඩසටහන යටතේ වයඹ පළාත් සමුපකාර දෙපාර්තමේන්තුවට වාණිජවේදී උපාධිධාරීන් 36 ක් හා කලා උපාධිධාරීන් 23 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන සමුපකාර සමිති විගණනය සඳහා කලා උපාධිධාරීන් යොදවා තිබූ බවත්, ආයතනයට තම ඉලක්ක කරා ලඟාවීමට එම නිලධාරීන්ගේ පුහුණුව සඳහා වැඩි කාලයක් හා පිරිවැයක් දැරීමට සිදුවන බවත් නිරීක්ෂණය විය.

(ආ) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල ලේඛණය ප්‍රකාරව කළමනාකරණ සහකාර නිලධාරීන් 12 දෙනෙකු සිටිය යුතු වුවත්, 2015 මැයි 31 දින වන විට නිලධාරීන් 07 දෙනෙකු පමණක් සිටි අතර නිලධාරීන් 05 දෙනෙකුගේ ඌනතාවයක් පැවතියද, ඒ සඳහා සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.11.2 අධ්‍යාපනය සම්බන්ධව ගුරු අතිරික්තය හා ඌනතාවය, අනුයුක්ත කිරීම්.**

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල්වලට පාසල් කාර්ය සහායකයින් අනුයුක්ත කිරීමේදී අවශ්‍යතාවය හෝ ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන ඔවුන් අනුයුක්ත කර නොතිබුණු අතර, පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාවට අනුපාතිකව 1:161 හා 1:1398 පරාසයක් වූ අනුපාතයක් යටතේ අනුයුක්ත කිරීම් සිදුකර තිබුණි.

(ආ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු පාසල් 337 ක සිටිය යුතු ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් වෙනුවට පහල ශ්‍රේණියක විදුහල්පති ශ්‍රේණිධාරින් වැඩකටයුතු කරන අවස්ථා පැවතුණු අතර, පාසල් 206 ක සිටිය යුතු ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් වෙනුවට ඉහල ශ්‍රේණියක ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් වැඩකටයුතු කරන අවස්ථා පැවතුණි.

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු පාසල් 10 ක සිටිය යුතු ශ්‍රේණිධාරි නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙනුවට ඊට වඩා පහල ශ්‍රේණියක ශ්‍රේණිධාරි නියෝජ්‍ය විදුහල්පතිවරුන් වැඩකටයුතු කරන බවත්, තවත් පාසල් 150 ක ශ්‍රේණිධාරි නියෝජ්‍ය විදුහල්පතිවරුන් සිටිය යුතු වුවත්, එම පාසල්වලට ශ්‍රේණිධාරී නියෝජ්‍ය විදුහල්පතිවරුන් අනුයුක්ත කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඈ) දෙපාර්තමේන්තුව සතු පාසල් 147 ක වැඩබලන විදුහල්පතිවරුන් කටයුතු කරන බවත් පාසල් 112 ක විදුහල්පතිවරුන් නොසිටින බවත් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආනකුත් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 257 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර, බඳවාගෙන තිබුණු ප්‍රාථමික මට්ටමේ තනතුරු 80 ක අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාසල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 4,968 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**6.11.3 සෞඛ්‍ය අංශය සම්බන්ධව එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවයන්**

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,577 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) රිදීගම දිස්ත්‍රික් රෝහල සඳහා අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා වෛද්‍ය නිලධාරීන් 06 දෙනෙකු සිටියදී 2014 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් යන මාසවලදී පිළිවෙලින් පැය 895, 1000 ක් හා 930 ක් සඳහා අතිකාල දීමනා වශයෙන් රු.1,061,980 ක් ගෙවා තිබුණි.

(ඇ) මාවතගම දිස්ත්‍රික් රෝහලේ තනතුරු 10 ක නිලධාරීන් 11 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, තනතුරු 07 ක නිලධාරීන් 25 දෙනෙකු අතිරික්තව පැවතුණි.

(ඈ) නිකවැරටිය මූලික රෝහලේ තනතුරු 04 ක නිලධාරීන් 08 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර තනතුරු 02 ක නිලධාරීන් 02 දෙනෙකුගේ අතිරික්තයන් පැවතුණි.

(ඉ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා ඖෂධ සංයෝජකයින් 05 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. විශේෂ දැණුමක් හා පුහුණුවක් තිබිය යුතු ඖෂධ සංයෝජකයින් විසින් ඉටුකරන රාජකාරි සඳහා සාමාන්‍ය කම්කරුවන් යොදවා තිබුණු අවස්ථාවන් විගණනයේදී නිරීක්ෂණය විය.

**6.12 බැංකු සැසඳුම්**

---------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තු 02 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක බැංකු ගිණුම් 18 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කර මාස 06 ඉක්ම වූ චෙක්පත්වල වටිනාකම රු.1,750,682 ක් වූ අතර, ඒවා සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් 07 ක රු. 29,651 ක හඳුනා නොගත් හර හා බැංකු ගිණුම් 06 ක රු. 252,088 ක හඳුනා නොගත් බැර කිරීම් පැවති අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**7.1 අභ්‍යන්තර විගණනය**

---------------------

වයඹ පළාත් සභාව යටතේ ඇති ආයතන කිසිවක අභ්‍යන්තර විගණන ඒකක ස්ථාපිත කර නොතිබුණි.

**7.2 විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සමාජ සුභසාධන අමාත්‍යාංශය, ආණ්ඩුකාරවර කාර්යාලය, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යන ආයතන විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**08 පද්ධති හා පාලනයන්**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුව තිබුණි.

(අ) ගිණුම්කරණය හා ආදායම් රැස්කිරීම

(ආ) වත්කම් හා මානව සම්පත් කළමනාකරණය

(ඇ) කොන්ත්‍රාත් ඉටුකිරීම් හා ගෙවීම්

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඉ) ප්‍රඥප්ති මත පිහිට වූ ආයතනවල මූල්‍ය කටයුතු හා මෙහෙයුම් පාලනය

(ඊ) වාහන භාවිතය